**උපදේශකත්වය**
එච්.ජී.ජේ ධර්මසේන
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව.

**මෙහෙයවීම**
මාධවි නිසංසලා ගුණවර්ධන
අධ්‍යක්ෂ
රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා
වෘත්තීය මාර්ගෝපදේශ අංශය
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව.

පී.ඒ.සී.ඩී. ජයමාලි
සහකාර අධ්‍යක්ෂ
ඩී. එම්. එස්. ආර්. ටී. දිසානායක
සහකාර අධ්‍යක්ෂ
රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා
වෘත්තීය මාර්ගෝපදේශ අංශය
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව.

**සංස්කරණය**
බී.ජී.තුෂාරි අනුරුද්ධිකා
වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරි

**පිටකවර නිර්මාණය**
චමල් හෙට්ටිආරච්චි

**ප්‍රකාශනය**
රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා
වෘත්තීය මාර්ගෝපදේශ අංශය
මිනිස්බල හා රැකීරක්ෂා
දෙපාර්තමේන්තුව
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා
අමාත්‍යාංශය.

**මුද්‍රණය**
සචින්ද ග්‍රැෆික් සිස්ටම්ස්
(පුද්ගලික) සමාගම
නො. 145, කාර්මික ජනපදය,
කටුවාන පාර, හෝමාගම.

## පෙළ ගැස්ම

**නවෝත්පාදන ආර්ථිකයක් සඳහා නැනෝ තාක්ෂණය** 3-5

**21 වන සියවසේ රැකියා ලෝකය සඳහා නව මිනිසෙකු බිහි කරගැනීමේ අවශ්‍යතාවය** 6-9

**මෘදු කුසලතා හැකියාවට හා ජීවිතයට** 10-13

**කුසලතා රැසකින් අපූර්ව සංකලනයක් සෑදූ කිෂු** 14-15

**කඩුව හොඳින් මුවහත් කරගන්නට නම්** 16-17

CV, BIO DATA **හදන්න පෙර හිතන්න** 19-21

**ජාතියට අභිමානයක් ගෙන දෙමින් ඉදිවන** NSBM 22-23

**දැනුම හා ව්‍යාපාර ක්‍රියා බාහිරකරණය** 24-26

**ස්වේච්ඡා සේවය තුළින් ජාත්‍යන්තර සංවිධානයක වෘත්තීය ගත වීමට** 27-28










# සංස්කාරක සටහන

## බහුවිධ කුසලතාවයන් නිර්මාණශීලීව ඔබේත් රටේත් දියුණුවට යොදාගන්න.

නව තාක්ෂණික දියුණුවත් සමඟ  මුළු ලෝකය තුළම පෙර නොවූ පරිවර්තනයක් සෑම ක්ෂේත්‍රයකම සිදු වී තිබේ. රැකියා ලෝකය තුළත් මෙම සීඝ්‍ර පරිවර්තනය දැක ගත හැකිය. ලෝකය රොකට් වේගයෙන් ගමන් කරනා විට අපි යන්නේ ඉබි ගමනෙන් නම් මෙම පරිවර්තනයන්ට ගැළපීමට අපට නුපුළුවන් වනු ඇත. එනිසා මෙම දිනෙන් දින සිදුවන පරිවර්තනයන්ට සාපේක්ෂව අපේ ජීවිතත් ඊට අනුරූපී ලෙස ධනාත්මකව වෙනස් කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

අද රැකියා ලෝකයට අවශ්‍ය වන්නේ බහුවිධ කුසලතාවන්, නිර්මාණශීලීව ප්‍රයෝජනයට ගත හැකි ගතික වූ පුද්ගලයින්ය. නව නිර්මාණ, නව සංකල්ප බිහි කළ හැකි පුද්ගලයින්ය.

මෙවැනි පරිසරයක් සකස් කිරීම උදෙසා පාසල් කාලයේ සිට නව නිර්මාණ, නව සංකල්ප බිහි කිරීම උදෙසා ළමුන් දිරිගැන්වීම, සිසුන්ට මඟපෙන්වීම අත්‍යවශ්‍ය වේ. නිර්මාණශීලී සංස්කෘතියක් පාසල තුළ ඇති කළ යුතුය. මේ තුළින් විභාගයට, පොතට කොටු වී සිටින දරුවන් වැඩි වැඩියෙන් නිර්මාණකරණයට යොමු වනු ඇත. අපේ රටේ නව නිර්මාණකරුවන් නව නිර්මාණ වරින් වර බිහි වුවත් ඔවුනට ඒ තුළින් ඉදිරියට යාමේ ඉඩ ප්‍රස්ථාව අවම වේ. එමනිසා නව නිර්මාණයක් බිහි කිරීමේ සිට එය වෙළඳපොළ නිෂ්පාදනයක් බවට පත්වීම දක්වා වන ක්‍රියාවලිය සඳහා ඔවුන් මෙහෙයවීම අත්‍යවශ්‍ය වේ. නව නිර්මාණ තුළින් රටට ප්‍රයෝජන ගත හැකි වන්නේ ඒ තුළින් පමණි. එසේම පාසල් පද්ධතිය, අධ්‍යාපන පද්ධතිය අනෙකුත් සමගාමී ආයතන නව නිර්මාණකරුවන් බිහි කිරීම සඳහා නිරන්තර සහයෝගය ලබා දීම අත්‍යවශ්‍ය වේ.

ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත යන පැරණි කියමනට සීමා නොවෙමින් ඔබ සතු බහුවිධ කුසලතාවයන් මනා ලෙස සංකලනය කරමින් ඉන් ප්‍රයෝජන ගත යුතුය. ඒ සංකලනය තුළින් නිර්මාණශීලී අපූරු මිනිසුන්, වෘත්තිකයින් බිහි වේ. මේ ලෝකය දියුණු කළේ එවන් අපූරු මිනිසුන්ගේ බහුවිධ කුසලතාවන් තුළිනි.

පොත පත විභාගයන් අත්‍යවශ්‍ය දෙයකි. නමුත් ජීවිතය යනු විභාගය පොත පත පමණක් නොවේ. එනිසා පාසලේ, ක්‍රීඩා පිටියේ සමාජයේ ඇති අනන්ත අවස්ථා තුළින් ඔබේ හැකියාවන් හඳුනා ගෙන දියුණු කරගත යුතුයි. එසේම එම හැකියාවන් නිර්මාණශීලී ලෙස යොදා ගනිමින් නව නිර්මාණ නව සංකල්ප බිහි කළ හැකි පුද්ගලයෙකු විය යුතුයි. ඔබේත් රටේත් ගැළවීමේ මාර්ගය එයයි. ඒ තුළින් ඔබ ලෝකයටම සුවිශේෂී පුද්ගලයෙකු වනු ඇත.

තුෂාරි අනුරුද්ධිකා
සංස්කාරක

# නවෝත්පාදන ආර්ථිකයක් සඳහා නැනෝ තාක්ෂණය



*අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනඟී.*

**මහාචාර්ය කේ.එම්. නලින් ද සිල්වා**
Science Team Leader
Sri Lanka Institute of Nanotechnology

රටක සංවර්ධනයක් වීමට නම් එම රටේ ජාතික ආදායම ඉහළ යා යුතු අතර නව නිපැයුම් වැඩි විය යුතුයි. ලෝකයේ දියුණු මට්ටමට පත් වූ බොහෝ රටවල් එම තත්ත්වයට පත් වුයේ අධි තාක්ෂණ හා නව නිපැයුම් හේතුවෙනි. ශ්‍රී ලංකාව ගත්විට අප රට තවමත් ආදායම් උපදවන්නේ සාම්ප්‍රදායික ක්‍රමයටමය. ශ්‍රී ලංකාවේ නව නිපැයුම් බිහි වන්නේ අතළොස්සකි. බිහි වන නව නිපැයුම් නිෂ්පාදනයක් බවට පත් වී වෙළෙඳපොළට පිවිසෙන්නේ ද ඉතාම අවම මට්ටමිනි. අප රටේ අධ්‍යාපන රටාව ගත්විට ද මෙවැනි නව නිපයුම් බිහිවීම සඳහා ඇත්තේ සීමිත ඉඩ ප්‍රස්ථාවකි. නමුත් ලෝකයේ වෙනත් දියුණු රටවල්, විශේෂයෙන් කොරියාව, ජපානය වැනි රටවල්වල අපට වඩා වැඩි ඉඩක් ඒ සඳහා පවතී. අප රටේ නව නිපැයුම් කිරීමට මෙන්ම බුද්ධිමය දේපල රැක ගැනීමට, පේටන්ට් බලපත්‍ර ගැනීමට දරුවන්ට ලෙහෙසි පහසු නැත. විද්‍යා හා තාක්ෂණික දියුණුව පිළිබඳ සිතන්නේ නම්, රටේ සංවර්ධනය පිළිබඳව සිතන්නේ නම් තාක්ෂණය හා විද්‍යාව ඇසුරින් කරන පර්යේෂණ, නව නිපැයුම් අත්හදා බැලීම් සඳහා අවස්ථාව දරුවන්ට ලබාදීම අත්‍යවශ්‍ය කාරණයකි.

ලෝකයේ වරින් වර හමා ආ කාර්මික, තාක්ෂණ රැලි බොහොමයක්ම ශ්‍රී ලංකාවෙන් ගිලිහී ගිය අවස්ථා එමටය. තොරතුරු තාක්ෂණය එලෙස දියුණු වීමට අපට ලැබුණු මහඟු අවස්ථාවකි. එහෙත් එහි ඵල අප රටට නෙලා ගත නොහැකි විය. ජනගහනයෙන් වැඩි කොටසක් දුරකථන පාවිච්චි කල ද ඉන් කුඩා කොටසක් හෝ නිපදවීමට අප රට උනන්දු වී නොමැත. කොරියාව, චීනය, වැනි රටවල් දුරකථන හා ඒවායෙහි අංගෝපාංග නිෂ්පාදනය කරන අතර ඒ කිසිවක් නිෂ්පාදනය නොකරන අපේ රටට හැකි වී තිබෙන්නේ එම රටවල කසල ගොඩක් බවට පත් වීමට පමණි. ජීව අනුක තාක්ෂණ යොදා ගනිමින් එන්නත් බෙහෙත් වර්ග පිළිබඳ පර්යේෂණ සිදුකිරීම තවත් වටිනා අවස්ථාවක් වුවද එය ද ප්‍රමාණවත් ලෙස රටේ සංවර්ධනයට දායක කරගෙන නොමැත. මේ නිසාම විද්‍යා තාක්ෂණය පිළිබඳව තවදුරටත් අප අවධානය යොමු කිරීමේ කාලය එළඹ ඇත.

ලෝකයේ අලුත්ම තාක්ෂණික රැල්ල නැනෝ තාක්ෂණයයි. එසේ නම් ලොව නවතම රැල්ල වු නැනෝ තාක්ෂණ රැල්ල ද අප අතින් ගිලිහෙන්නට ඉඩ දෙමුද?

අප මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජාතික නැනෝ තාක්ෂණ ආයතනයේ මහාචාර්ය නලින් ද සිල්වා මහතා හමු වුයේ විද්‍යාව හා මේ සම්බන්ධව වඩාත් විස්තරානුකූලව දැනගැනීමේ අටියෙනි.




## නැනෝ තාක්ෂණය යනු කුමක්ද?

අපි තාක්ෂණික මෙවලම් සාදා ගැනීමට පෙළඹී සිටින්නේ මහා පරිමාණ අමුද්‍රව්‍ය යොදා ගැනීම හරහායි. ඉන් අපතේයාම්, අහිතකර බලපෑම් සිදු වෙනවා. බලාපොරොත්තු වෙන නියම නිෂ්පාදනය ලබාගන්නත් අමාරුයි. නමුත් නැනෝ තාක්ෂණය හරහා පහළ සිට ඉහළට යන ප්‍රවේශය මගින් මේ දුර්වලතා අඩු කරගන්න පුළුවන්. නිෂ්පාදනයේදී භාවිතා කරන කුඩාම ඒකකය පරමාණුවයි. පරමාණු අණු පාවිච්චි කරමින් යමක් නිපදවීම හා එය නැනෝ මට්ටමින් හසුරවා අපට අවශ්‍ය අධි තාක්ෂණය සහිත ද්‍රව්‍ය නිපදවා ගැනීම මින් අදහස් වේ. නැනෝ මීටරයක් යනු මීටරයකින් බිලියනයකින් පංගුවයි. නැනෝ පරාස 1-100 නැනෝ මීටර අතර සාදා ගන්නා නිෂ්පාදන නැනෝ තාක්ෂණයෙන් සාදාගන්න නිෂ්පාදන වේ. යම් කිසි පදාර්ථයක් නැනෝ මට්ටමට කුඩා කළ විට එහි ගුණ එනම් භෞතික, රසායනික චුම්භක ගුණ වෙනස් වනවා. සාමාන්‍ය වශයෙන් සම්පුර්ණ වෙනස් දෙයක් බවට පත්වනවා. ඉන් ලබන ප්‍රයෝජනත් වෙනස්. උදාහරණයක් ලෙස රත්තරන් නැනෝ අවස්ථාවට පත් කළ විට එහි විවිධ වර්ණ දකින්න පුළුවන්. මේ ගැන මුලින්ම ප්‍රකාශ කළේ 1959 දී රිචර්ඩ් ෆෙයින්මන් කියන විද්‍යාඥයායි. මුලදී මිනිසුන් ඔහුව හාස්‍යයට ලක් කළා. පරමාණුව අල්ලන්නේ කොහොමද කියා. නමුත් 1965 දී ඔහුට භෞතික විද්‍යාව සඳහා නොබෙල් තෑග්ග හිමි වුණා.

## මේ තාක්ෂණය අපට වැදගත් වන්නේ කොහොමද?

මෙය පාරිසරික වශයෙන් ඉතා වැදගත් සංකල්පයක්. මොකද අපේ සම්පත් සීමිතයි. නමුත් නැනෝ තාක්ෂණය මගින් යමක් නිෂ්පාදනය කිරීමේ දී සම්පත් අපතේ යන්නේ නැහැ. මෙය පරිසර සංවර්ධනයට ඉතා වැදගත්. මින් පරිසරය සංරක්ෂණය වෙනවා. මේ මොහොත වන විට ලෝකයේ බොහොමයක් ගැටලු ඇති වී තිබෙනවා. පිරිසිදු ජලය සඳහා දිනෙන් දින ඉල්ලුම වැඩියි. ලෝකයේ පවතින සාගතයට නිවැරදි විසඳුම් අවශ්‍යයි. එසේම විශාල වශයෙන් ශක්ති ජනක අර්බුදයන් වලට ලෝකයට මුහුණ දීමට සිදු වී තිබෙනවා. සූර්ය පැනල ශක්තිය භාවිතා කිරීම වුවද වර්තමානයේ ඉතාම අඩු මට්ටමකයි පවතින්නේ. එහෙත් නැනෝ තාක්ෂණය භාවිතය සමගින් විශේෂ නැනෝ සංයෝග නිර්මාණය කිරීමෙන් ශක්ති භාවිතය අවම වී තිබෙනවා. සූර්ය බලවේගය ඉතාම කාර්යක්ෂම ලෙස භාවිතය හා ප්‍රවාහනය සිදු කිරීමට හැකි වී තිබෙනවා. විද්‍යාඥයින් මේ වන විට පර්යේෂණ කරමින් සිටිනුයේ බහු අවයවික මගින් ඉතා සංවේදී සූර්ය පැනල නිර්මාණය කිරීමටයි.

යම් දවසක නැනෝ තාක්ෂණය භාවිත කර නිපදවන ලද සායම් තීන්ත අපේ වහලේ ආලේප කිරීමෙන් සූර්යාගෙන් ලැබෙන ශක්තිය මගින් මෙම තීන්ත වල ඇති බහු අවයවික මගින් ශක්තිය නිෂ්පාදනය කිරීමට හැකි වේ.

මේ වන විට නැනෝ පෙරනවලින් සම්පූර්ණයෙන්ම පෙරන වතුර නිර්මාණය කිරීමට හැකිවී ඇත. කෘෂි කර්මාන්තය සඳහා ඉතා ප්‍රයෝජනවත් කාර්යක්ෂම පොහොර මේ තාක්ෂණය යොදාගෙන නිපදවා තිබෙනවා. රූපලාවන්‍ය ක්ෂේත්‍රය තුළ විවිධ ආලේපන නැනෝ තාක්ෂණය හරහා නිෂ්පාදනය කර තිබෙනවා. එසේම ඉංජිනේරු තාක්ෂණය හා පරිගණක තාක්ෂණයේ දියුණුවට ද මෙය යොදාගත හැකියි. වෛද්‍ය විද්‍යාවේද පරීක්ෂණ කටයුතු සාර්ථක කර ගැනීමටත් ශල්‍යකර්මවලදී භාවිතා කරන උපකරණ හා භාණ්ඩ ඉතාම ප්‍රමිතියකින් යුක්තව නිපදවීමට මහඟු පිටිවහලක් මෙම නැනෝ තාක්ෂණය මඟින් ලැබේ.

විද්‍යාඥයන් විසින් සොයා ගන්නා ලද සමහර ද්‍රව්‍ය අතරින් ටයිටේනියම්, ඩයොක්සයිඩ් වැනි ද්‍රව්‍ය නැනෝ තාක්ෂණයේදී රෙදිවල තිබෙන කාබනික අංශු සූර්ය ශක්තිය මාර්ගයෙන් විනාශ කරන බවට සොයා ගෙන තිබෙනවා. එනම් රෙදිපිළිවල තිබෙන අපද්‍රව්‍ය අංශු ඉවත් කිරීමෙන් ඒවා ඉතාම පිරිසිදු හා දීප්තිමත් ඒවා බවට පත් වෙයි. මේ නිසා අපට රෙදි පිරිසිදු කිරීම සඳහා වතුර හා සබන් තවදුරටත් අවශ්‍ය වන්නේ නැත. එලෙස සේදීමකින් තොරව භාවිතා කළ හැකි රෙද්දක් නැනෝ තාක්ෂණය ආයතනය මඟින් නිපදවා තිබෙන අතර ඇඟළුම් කර්මාන්ත සම්බන්ධයෙන් එහි පේටන්ට් බලපත්‍ර කීපයක් ලබාගෙන තිබෙනවා. මෙය ලංකාව ලබාගත් ජයග්‍රහණයකි.

මෙවැනි පරීක්ෂණ ශ්‍රී ලංකාවේ ද සිදුවෙනවා නම් ශ්‍රී ලංකාවේ නව නිර්මාණකරුවන්ට ව්‍යාපාරවලට අතහිත දීමට අපට පුළුවන්. ඒ වෙනුවෙනුයි නැනෝ තාක්ෂණ ආයතනය තිබෙන්නේ.

## මේ නැනෝ තාක්ෂණය පරිසරයට හිතකරද?

වගකීමක් නැතිව පාවිච්චි කළොත් හානිවෙන්න පුළුවන්. නැනෝ අංශු පරිසරයට මුදා හරින කොට පරිස්සමෙන් එය කළ යුතුයි. නැනෝ තාක්ෂණය අපේ ස්වභාව දහමෙත් පවතිනවා. නෙළුම් කොළේ වතුර රැඳෙන්නේ නැත්තේ එහි නැනෝ අංශු ඇති නිසයි. හූනා සිවිලිමේ අනිත් පැත්තට යන්නේ උගේ කකුලේ නැනෝ අංශු ඇති නිසයි. ඒ විතරක් නොවේ අතීතයේ අපේ මුතුන් මිත්තන්ගේ පවා මෙම සිද්ධාන්ත පිළිබඳව දැනගෙන සිටි බවට ඓතිහාසික සාධක හමුවී තිබෙනවා. ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයේ විද්‍යාඥයින් කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ වසර 600ක් පැරණි ජනේලයක වීදුරුව මත ඇති පැල්ලම් රත්තරන් පැල්ලම් ලෙස සොයා ගන්නා ලද අතර ඒවා නැනෝ රත්තරන් බවත් පාට වෙනස් නොවන්නේ එහෙයින් බවත් සොයා ගෙන තිබෙනවා. මේ අනුව හිතකර ලෙස භාවිතා කිරීමෙන් නැනෝ අංශු පරිසර හිතකාමී ලෙස භාවිතා කළ හැකියි.

## මෙය ශ්‍රී ලංකාවට ගෙන ඒමට යොදා ඇති පියවර

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති ජාතික විද්‍යා පදනම මඟින් ජාතික නැනෝ තාක්ෂණ ආයතනය පිහිටුවා තිබෙනවා. මෙය සමාගම් 06 ක එකතුවකින් නිර්මාණය වී ඇත. දැනට අංග සම්පූර්ණ නැනෝ තාක්ෂණ විද්‍යාගාරයක් අප සතුව ඇති අතර විද්‍යාඥයින්ට හා පර්යේෂකයින්ට මෙහි අවශ්‍ය පර්යේෂණ කිරීමට පහසුකම් සැපයීමෙන් පිටරටට ඇදී යන විශාල ධනයක් අප රට තුළ ඉතිරි කර ගැනීමට හැකි වී තිබෙනවා. එය විද්‍යාඥයින් බිහි වීමට ද රුකුලක්. විශ්ව විද්‍යාලවල සිසුන්ටත් මෙම ආයතනයේ පර්යේෂණ කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙනවා. නැනෝ තාක්ෂණ අන්වීක්ෂ තියෙන්නේ ශ්‍රී ලංකාවටම මෙම ස්ථානයේ පමණයි. මෙය අධිතාක්ෂණ විෂය පථයක්. මෙයට ඇලුම් කරන දක්ෂ දරුවන්ට මෙම ආයතනය අනුග්‍රහය ලබා දෙනවා. මෙය විද්‍යා විෂය ධාරාව හැදෑරූ දරුවන්ට හා නව නිපැයුම් ක්ෂේත්‍රයේ නියැලී සිටින දරුවන්ට ප්‍රවේශ විය හැකි වෘත්තීය ක්ෂේත්‍රයක් වෘත්තීය සංවර්ධනය සඳහා යොදා ගත හැකි ක්ෂේත්‍රයක්.

අප රටට නවෝත්පාදන ආර්ථිකයක් අවශ්‍යයි. විද්‍යා පදනමත්, නවෝත්පාදන කොමිසමත් අපේ රටේ මෙම තාක්ෂණය දියුණු කිරීමට උත්සහ කරමින් සිටී. ඔබේ වගකීම විය යුත්තේ නැනෝ තාක්ෂණය, නවෝත්පාදන සඳහා යොදා ගනිමින් නවෝත්පාදන ආර්ථිකයක් මඟින් රට සංවර්ධනය කිරීමයි.



සාකච්ඡා කොට සකස් කලේ
එරන්දතී රන්දෙනිය
වෘත්තීය මාර්ගෝපදේශ නිළධාරි
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

# 21 වන සියවසේ රැකියා ලෝකය සඳහා නව මිනිසෙකු බිහි කර ගැනීමේ අවශ්‍යතාව





මහාචාර්ය දයාරෝහණ අතුකෝරාල
අධ්‍යක්ෂ
ධනාත්මක මනෝ විද්‍යා ආයතනය

ඉතිහාසයේ අන් කවර කලකටත් වඩා 21 වන ශත වර්ෂයේ හැම ක්ෂේත්‍රයකම වෙනසක් හා නව මුහුණුවරක් ඇති වෙමින් පවති. රැකියා ලෝකය ද, රැකියා අවස්ථා ද, රැකියා සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය ද, සේවක මණ්ඩලය සතු විය යුතු දක්ෂතා හා ගුණාංග කවරේද යන්නත් වෙනස් වෙමින් පවති. මේ නිසා නව ලෝකයේ රැකියා ලබා ගැනීමට අපේක්ෂා කරන රැකියා අපේක්ෂිතයින් ද රැකියා ලෝකයේ නව ප්‍රවණතා හඳුනාගෙන ඊට අනුකූලව හැඩ ගැසිය යුතුව ඇත. සූදානම් විය යුතුය. එසේම රැකියා ලබාදෙන ආයතන හා කර්මාන්ත ශාලා ද ඒ පිළිබඳව දැනුවත්වීම අවශ්‍යය. සාර්ථක ව්‍යාපාරයක් පවත්වා ගැනීමට ස්වාමි පක්ෂය හෙවත් අධ්‍යක්ෂ මණ්ඩලය ද, ධනාත්මක මනෝ විද්‍යාඥයින් විසින් පෙන්වා දෙන නව ප්‍රාග්ධනය පිළිබඳ උනන්දු විය යුතුය. රැකියා ලබා ගැනීම සඳහා සූදානම් වන රැකියා අපේක්ෂකයින් ද මෙම නව ප්‍රවණතාව පිළිබඳව අවබෝධයෙන් කටයුතු කළ යුතු කාලය එළඹ ඇත.

ඇමරිකාවේ නෙබ්‍රස්කා (NEBRASKA) විශ්ව විද්‍යාලයේ ධනාත්මක මනෝ විද්‍යාව පිළිබඳ මහාචාර්ය (FRED LUTHANS) ෆ්‍රෙඩ් ලතන්ස් විසින් ප්‍රාග්ධනය හෙවත් සම්පත් පිළිබඳව අප විසින් සිතිය යුතු නව මානයක් පිළිබඳව අදහස් ඉදිරිපත් කර ඇත. මෙම නව මතය, රැකියා ලෝකයට නව මාවතක් ඉදිකර දීමට සමත්ව ඇත. නව ප්‍රාග්ධනය පිළිබඳ මෙම මතය අනුව ආයතනයක දියුණුව පිළිබඳව වඩාත් වැදගත් වන ප්‍රාග්ධනය වන්නේ මානව ප්‍රාග්ධනයයි. (HUMAN CAPITAL) සෑම තනි තනි පුද්ගලයකුම වත්කමක් බව ඔහු පැහැදිලි කර ඇත.

මහාචාර්ය ෆ්‍රෙඩ් ලතන්ස් තම මතය ඉදිරිපත් කිරීමේදී පෙර පැවති ප්‍රාග්ධන සංකල්පය ක්‍රමයෙන් විකාශනය වූ ආකාරයත්, ඉදිරියට එම ප්‍රාග්ධන සංකල්පයන්හි සිදු වෙමින් පවතින නව නැඹුරුව පිළිබඳවත්, කරුණු ඉදිරිපත් කර ඇත. ඔහු එම විකාශනය පැහැදිලි කිරීමට මෙම සටහන ඉදිරිපත් කරයි.

| සාම්ප්‍රදායික ආර්ථික ප්‍රාග්ධනය | මානව ප්‍රාග්ධනය | සමාජ ප්‍රාග්ධනය | ධනාත්මක මනෝ විද්‍යා ප්‍රාග්ධනය |
|---|---|---|---|
| ඔබ සතුව ඇත්තේ කුමක්ද? → WHAT YOU HAVE → | ඔබ දැන සිටින්නේ කුමක්ද? → WHAT YOU KNOW → | ඔබ දැන සිටින්නේ කවුරුන් ගැනද? → WHO YOU KNOW → | ඔබ යනු කවරෙක්ද? WHO YOU ARE |
| • මූල්‍යමය ශක්තිය<br>• නියත වත්කම් (උපකරණ පේටන්ට් බලය කම්හල් ගොඩනැගිලි) | • අත්දැකීම්<br>• අධ්‍යාපනය<br>• කුසලතා<br>• දැනුම<br>• අදහස් | • සබඳතා<br>• සබඳතා ජාලය<br>• මිතුරන් | • ආත්ම විශ්වාසය<br>• අපේක්ෂාව<br>• සුභවාදී දැක්ම<br>• ඔරොත්තු දීමේ හැකියාව |

**සාම්ප්‍රදායික ආර්ථික ප්‍රාග්ධනය** (TRADITIONAL ECONOMIC CAPITAL)

ඔබ සතුව ඇත්තේ කුමක්ද? යන ප්‍රශ්නයට දෙන පිළිතුර අනුව ආර්ථික ප්‍රාග්ධනය අදහස් කෙරේ. ඒ අනුව ඒ ඒ ආයතන සතුව ඇති මූල්‍යමය හා භෞතික සම්පත් අදහස් කෙරේ. මේ වත්කම් සඳහා දැවැන්ත මූල්‍ය ශක්තියක් තිබිය යුතු බව සත්‍යයකි. ආයතනයක සාර්ථකත්වය මැනීමේදී මෙම ගොඩනැගිලිවල සහ මුදල්මය වටිනාකම වැඩි කරගැනීම අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පෙර දී සැලකුණි. පෙරදී මෙම සම්පත්වල බහුලතාව ආයතනයක වටිනාකම තීරණය කිරීමේ හා ආයතනවල දියුණුව ගණනය කිරීමේ දී ප්‍රධානම සාධකය ලෙස සැලකුණි. එසේ නමුත් 21 වන ශත වර්ෂයේ දී මෙම මූලික පිළිගැනීම බිඳ වැටී ඇත. මේ සම්පත් ඉහළින්ම තිබුණු හා තිබෙන සංස්ථා, කර්මාන්ත ශාලාවලට 21 වන සියවසේදී තම පැවැත්ම තහවුරු කර ගත නොහැකි වූ අවස්ථා එමට ඇත.

**මානව ප්‍රාග්ධනය** (HUMAN CAPITAL)

මානව ප්‍රාග්ධනය යනුවෙන් අදහස් කරනුයේ ආයතනයක සේවය කරනු ලබන සියලුම තලයන්හි සේවක මණ්ඩලයයි. ලොව ප්‍රබලම ව්‍යාපාරික නායකයකු වන බිල් ගේට්ස් වරෙක ප්‍රකාශ කලේ තමාගේ සමාගමේ වටිනාම වත්කම් සෑම රාත්‍රියකම ගොඩනැගිල්ලෙන් බැහැරට පිටත්ව යන බවයි. මයික්‍රොසොෆ්ට් සමාගම අන් සමාගම් අභිබවා ඉදිරියට පැමිණීමට හේතුව ලෙස ඔහු අවධාරණය කරනුයේ ඔහුගේ සේවක මණ්ඩලය සතු අත්දැකීම්, අධ්‍යාපනය, කුසලතා හා දැනුමයි. මේ අනුව පෙර දී ඔබ සතුව ඇත්තේ කුමක්ද? යනුවෙන් නගන ලද ප්‍රශ්නය වෙනුවට ඔබ දැන සිටින්නේ කුමක්ද? යන ප්‍රශ්නය වර්තමානයේ මතු කර ඇත.

මෙම ප්‍රශ්නයට දෙන පිළිතුරෙහි අන්තර් ගත වන්නේ මානව සම්පත සහ එම සම්පත සඳහා වත්කම් වන අත්දැකීම්, අධ්‍යාපනය, කුසලතා, දක්ෂතා සහ දැනුම ආදියයි. මානව සම්පත යනු එම සේවක මණ්ඩලය විදහා දක්වනු ලබන හැකියා සමුදායයි. එම කුසලතා සහ ඔවුන් සතු ඥානය එම සමාගම් වල කීර්ති නාමය ප්‍රචලිත කිරීමට හේතු සාධක වී ඇත. උදාහරණ ලෙස (NIKE) නයික් සමාගම හඳුන්වනුයේ ඉස්තරම්ම තත්ත්ව කළමනාකරණ ආයතනයක් ලෙසයි.

ජෙනරල් ඉලෙක්ට්‍රික් සමාගම සහ මයික්‍රොසොෆ්ට් සමාගම ප්‍රශංසා ලබනුයේ නව අදහස් අත්හදා බලන සේවක මණ්ඩලයකින් සපිරි ආයතන ලෙසය. මේ අයුරින් භෞතික හා මූල්‍යමය වත්කම් වලට දෙන ලද වටිනාකම අභිබවා, මානව වත්කම් සතු වටිනාකම අගය කරන්නට වැඩ ලෝකය පෙළඹුණි.

**සමාජ ප්‍රාග්ධනය** (SOCIAL CAPITAL)

මානව ප්‍රාග්ධනයට සමීප සබඳතාවක් සමාජ ප්‍රාග්ධනය යන්නෙහි ද ඇතුළත්ය. එහිදී නඟනු ලබන ප්‍රධාන හර ප්‍රශ්නය වනුයේ ඔබ දැන සිටින්නේ කවරහුද? යන්නයි. ව්‍යාපාර දියුණු කර ගැනීමේදී සහ නිෂ්පාදන අලෙවි කර ගැනීමේදී ඒ ඒ ව්‍යාපාර සතුව ඇති සම්පත් ජාලය, දැන සිටින හා සබඳතා පවත්වන සමාජය හා මිතුරන් සංඛ්‍යාව මත සමාගමක දියුණුව හා වත්කම තීරණය වන බව මෙයින් අදහස් කෙරේ. ආයතනයකට තම ඉලක්ක තීරණය කිරීමේදී හා මතුවන කවර හෝ ගැටලුවකට හෝ අභියෝගයකට මුහුණදීමේ දී මෙම සමාජ සබඳතා ජාලය හෙවත් සමාජ ප්‍රාග්ධනය පහසුකම් සලසාලනු ලබයි.

අසීරු සහගත අවස්ථාවකදි වුවත් තමා කා සමග කතා බහ කළ යුතු ද සබඳතා පවත්වා ගත යුතු ද යන්න සේවක මණ්ඩලය දැන සිටීම හා ක්‍රියාත්මක වීම මත ඔවුන්ගේ කාර්ය පහසු කරයි. ආයතනය තුළ හා ආයතනයෙන් බැහැරව සාර්ථක සබඳතා ජාල ක්‍රියාත්මක කිරීමේ හැකියාව ආයතනවල දියුණුවට උදව් වන හෙයින් වර්තමානයේදි සමාජ ප්‍රාග්ධනයට වැඩි වටිනාකමක් ලබා දෙයි. මේ අනුව සමාජ ප්‍රාග්ධනයෙහි වටිනාම වත්කම් භාණ්ඩය වනුයේ උපදෙස් හා සහයෝගි සබඳතාවයි.

**ධනාත්මක මනෝ විද්‍යා ප්‍රාග්ධනය** (POSITIVE PSYCHOLOGICAL CAPITAL)

සමාජ විද්‍යාඥයන් හා ආර්ථික විද්‍යාඥයන් වඩාත්ම අවධාරණය කරනු ලබන නවතම ප්‍රාග්ධනය වනුයේ ධනාත්මක මනෝ විද්‍යා ප්‍රාග්ධනයයි. මහාචාර්ය ලතන්ස් ඇතුළු පර්යේෂක කණ්ඩායම

මෙම ධනාත්මක මනෝ විද්‍යා ප්‍රාග්ධනයෙහි ප්‍රධාන සාධක හතරක් අන්තර්ගත කර ඇත. එනම්, ස්වයං සඵලත්වය (Self Efficiency) (අපේක්ෂිත ඉලක්කය කරා ලගා වීමට පුද්ගලයකු තුළ ඇති හැකියාව පිළිබඳ ආත්ම විශ්වාසය) අපේක්ෂාව (Hope) අපේක්ෂිත ඉලක්කය කරා ලගා වීමට අවශ්‍ය මාවත් සොයා ගැනීමේ ඇති හැකියාව, ශුභවාදී බව (Optimism) පවත්නා හේතු සාධකවලට ඇතුළාන්තයෙන්ම ස්ථිරව කටයුතු කරමින් යහපත් ප්‍රතිඵල අගය කිරීමට ඇති හැකියාව සහ ඔරොත්තු දී යළි නැගී සිටීමට (Resiliency) ඇති හැකියාව යන්නයි. එනම් දුෂ්කර ආපදා අවස්ථාවකදී එම පීඩාව ඉවසා දරා ගෙන නැගී සිටීමට ඇති හැකියාවයි.

ඉහත මතය ඉදිරිපත් කරමින් මහාචාර්ය ලුතන්ස් පෙන්වා දෙනුයේ අප 21 වන ශතවර්ෂයට ගමන් කරන විට, ව්‍යාපාරිකයන් ද තවදුරටත් සාම්ප්‍රදායික ආර්ථික හා මූල්‍ය වත්කම් සංකල්පයෙහි එල්බ සිටීම නිවැරදි නොවන බවයි. මේ සංකල්පය අනුව වර්තමාන හා අනාගත වැඩ ලෝකයේ වැඩි වටිනාකමක් ලැබෙනුයේ මානව ප්‍රාග්ධනය, සමාජ ප්‍රාග්ධනය හා ධනාත්මක මනෝ විද්‍යා ප්‍රාග්ධනය කෙරෙහි බවයි. ඊට අනුකූලව ස්වාමි පක්ෂයත්, සේවක පක්ෂයත් ශක්තිමත් කළ යුතු බව ලුතන්ස් පෙන්වා දෙයි.

ස්වයං සඵලත්වය, ශුභවාදී දැක්ම, අපේක්ෂාව හා ඔරොත්තු දී යළි නැගී සිටීමේ මානසික ගුණාංග රැකියා අපේක්ෂිත කණ්ඩායම් තුළ ගොඩනැංවීම ඔවුනට අනාගතයේ රැකියා ලෝකයට පිවිසීමේ දොරටු හැර දෙන සාධකය වනු ඇත.

21 වන ශත වර්ෂයේ ඇති විවිධ නව තාක්ෂණ හා කාර්මික දියුණුව හමුවේ අධි අපේක්ෂා සහ අධිවේගී සංවර්ධන ක්‍රියාකාරිත්වය හමුවේ සහ තරගකාරී ව්‍යාපාර ලෝකයේ තම පැවැත්ම තහවුරු කර ගැනීම වර්තමාන ව්‍යාපාරිකයන්ට අභියෝගයක්ව ඇත. මෙම තරගකාරී, ඉලක්කවාදී ක්‍රියාදාමයේ දී භෞතික ප්‍රාග්ධනයට වඩා වටිනාකමක් ඇත්තේ මානව සමාජ ප්‍රාග්ධනයටය. ඒ අතරින් ද සේවක මණ්ඩලය දරණ ආකල්ප ධනාත්මක මනෝ විද්‍යාඥයින් පෙන්වා දෙන ගුණාංග වලින් යුතු නොවන්නේ නම් ඉහත කී භෞතික මානව සහ සමාජ ප්‍රාග්ධනය ද ශක්තිමත් හා බලවත් කරගත නොහැකි වනු ඇත.

මේ නිසා මහාචාර්ය ලුතන්ස් ඇතුළු පර්යේෂණ කණ්ඩායම, රැකියා අපේක්ෂිත නවකයන් තුළ ස්වයං සඵලත්වය, ශුභවාදී බව, අපේක්ෂා හා විපත් හා ව්‍යසන අවස්ථාවකදී වුව ද ඔරොත්තු දී යළි හිස ඔසවා ගත හැකි ගුණාංග වර්ධනය කරලීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත.

මේ අනුව වෘත්තීය උපදේශන ක්‍රියාවලියේ භූමිකාව ද පෙරට වඩා වෙනස් මඟක් ගත යුතුව ඇත. පවත්නා රැකියා වලට ඒ ඒ පුද්ගලයා තුළ ඇති කුසලතාව සොයා ගලපාලන සාම්ප්‍රදායික වෘත්තීය උපදේශන ක්‍රියාවලිය වෙනුවට, කවර රැකියාවකට ඇතුළු වීමට වුවද අවශ්‍ය වන සාර්ථකත්වයට ළගා වීමට යෝග්‍ය, ධනාත්මක මනෝ විද්‍යාත්මක පෞරුෂ ගුණාංග, නව පරපුර වෙතට සම්ප්‍රේෂණය කර, 21 වන සියවසේ ආයතනවල පැවැත්ම තහවුරු කරගත හැකි කාර්ය මණ්ඩලයක් පත් කර ගැනීමට ස්වාමි පක්ෂය දක්වන උනන්දුවට යෝග්‍ය, ගැලපෙන මානව සම්පතක් බිහිකරලීම අප සතු වගකීම හා අභියෝගය වන්නේය.

මෙම නව නැඹුරුව කෙරෙහි මනෝ උපදේශකවරුන්, අධ්‍යාපනඥයින් හා වෘත්තීය උපදේශකවරුන් අවධානය යොමු කරලීම අවශ්‍ය බව මහාචාර්ය ලුතන්ස් අවධාරණය කරයි.

අපේක්ෂාව (Hope) පිළිබඳ ගුණාංගය සහිත ආයතන හා ආයතන ප්‍රධානීන්ගේ ගති ලක්ෂණ මෙන්ම ඉහත අපේක්ෂා සහිත කාර්ය මණ්ඩල සතු ගුණාංග කවරේ දැයි ඔවුන් විසින් ගොනු කොට දක්වා ඇත. ඉහළම අපේක්ෂා සහිත සේවක මණ්ඩලය ලෙස හඳුනාගත් සේවක මණ්ඩලය සතු ගුණාංග කිහිපයක් ඉදිරිපත් කර ඇත.

අඩු අපේක්ෂා සහිත පුද්ගලයන්ට වඩා, ඉහළ අපේක්ෂා සහිත පුද්ගලයන් සාපේක්ෂකව දක්වන වෙනස්කම් ඔවුන් විසින් මෙසේ ගොනු කර දක්වා ඇත. ඒවා නම්, ඔවුන් රැකියා පිළිබඳ ප්‍රබල අවදි බවකින් හෙවත් සවිඥාණික බවකින් යුක්තය. ඔවුන් තම සහෝදර සේවක මණ්ඩලයට සහ අවට ප්‍රජාවට උදවු කරන සුළු ආකල්පයකින් යුක්තය. ඔවුන් තම සහයක සේවක සහෝදරයන් හා පාරිභෝගිකයන් සමග සුහදශීලීව කටයුතු කරයි. විශේෂයෙන්ම අන්තර් ක්‍රියාකාරකම් හා සාකච්ඡා පවත්වනු ලබන අසීරු අවස්ථාවලදී එම සුහදතාවය ආරක්ෂා කරයි. තම සහෝදර සේවකයන්ට ප්‍රශංසා, ත්‍යාග දිරි දීමනා, ශිෂ්‍යත්ව ලැබෙන අවස්ථාවලදී ඒ පිළිබඳව සුබවාදී ප්‍රතිචාර දක්වයි. අසීරුතා වලට මුහුණ දීමට සිදුවූ අවස්ථාවල දී ඔවුන් කළමනාකාරීත්වයට හෝ පාරිභෝගිකයන්ට චෝදනා හෝ අපවාද නොකරයි. ඔවුන් පැහැදිලි ජීවන ඉලක්ක සහිතය.

අපේක්ෂිත ඉලක්ක කරා ලගා වීමට බහු විධ මාවත් හා වඩාත් යහපත් මාවත් සොයා ගනී.

ස්වයං සඵලත්වය, ශුභවාදී දැක්ම, අපේක්ෂාව හා ඔරොත්තු දී යළි නැගී සිටීමේ මානසික ගුණාංග රැකියා අපේක්ෂිත කණ්ඩායම් තුළ ගොඩනැංවීම ඔවුනට අනාගතයේ රැකියා ලෝකයට පිවිසීමේ දොරටු හැර දෙන සාධකය වනු ඇත.



සාමාන්‍ය රැකියා අවස්ථාවලදි සතුටින් හා සැහැල්ලුවෙන් යුතුව සේවය කරන අතර අසීරු, පීඩාකාරී අවස්ථාවලදී ඔවුහු වඩාත් ඉහළ ජවයකින් යුතුව ක්‍රියාකාරී වෙති. ඉහත කී ගුණාංග සහිත සේවක මණ්ඩලයක් බඳවා ගැනීමට ස්වාමි පක්ෂය කැමැත්තක් දක්වන නිසා ඉහත කී ගුණාංග, ආකල්ප හා මානසික නැඹුරුවක් සහිත තරුණ පරපුරක් ගොඩ නැංවීම, එහි වටිනාකම පහදා දීම සහ ධනාත්මක මනෝ විද්‍යාත්මක මග පෙන්වීමක් ලබා දීම 21 වන ශත වර්ෂයේ මනෝ උපදේශකවරුන්ගේ හා අධ්‍යාපනඥයන්ගේ වගකීම වන්නේය. මෙම කාර්යය සාර්ථකව හා සඵලවත්වයෙන් යුතුව ඉටු කරලීමට ගත යුතු පියවර කිහිපයකි. ඒවා මෙසේය, ඒ ඒ ශිෂ්‍යයා සතු සහජ බුද්ධි දක්ෂතා හඳුනා ගෙන එම හැකියා වලට අනුකූලව අධ්‍යාපනය ලබා ගනිමින් අවස්ථා හා පහසුකම් ලබාදීම. තම තමන් සතු සුවිශේෂ හැකියාවන් හඳුනාගත් පසු ඒ කෙරෙහි රුචිය වර්ධනය කරගෙන හැකියා ශක්තිමත් කර ගැනීම සඳහා ශක්තිමත් අභ්‍යාස කිරීමට දිරිමත් කිරීම. ශුභවාදී මානසිකත්වයක් වර්ධනය කිරීමට අවශ්‍ය මග පෙන්වීම මාර්ගෝපදේශය හා පුහුණුකිරීම. ස්ව බලය, ස්වයං සඵලත්වය පිළිබඳව හඳුන්වා දෙමින් තම තමන් සතු දක්ෂතා හඳුනා ගැනීමට දිරි දීම. ඉලක්ක ගොඩනගාගෙන එම ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මානසික ශක්තිය වර්ධනය කරලීම. අභියෝග වලට අභියෝගයක්ව පීඩාකාරි ව්‍යසන පරදවා යළි හිස ඔසවන ෆීනික්ස් පක්ෂියකු මෙන් ශක්තිමත් කිරීම ආදී ලෙස ධනාත්මක ස්ව සංකල්පයක් වර්ධනය කරලීම ද අධ්‍යාපනඥයන්ගේ වගකීම වන්නේය. 21 වන සියවසේ අභියෝගයට හා තරඟකාරී සමාජ අර්බුදය හමුවේ නොසැලී කටයුතු කළ නොහැකි වන පුද්ගලයෙකුට ආයතනයකට හෝ රටකට වුවද පැවැත්මක් නැතුව යන්නේය. අභියෝග හමුවේ පැවැත්ම තහවුරු කරගත හැකි වනුයේ ඉහත කී ධනාත්මක මනෝ විද්‍යා ගුණාංග සහිත ආයතනයක් බවට, පුද්ගලයෙකු බවට පත්වීම මගින් පමණි. මේ නිසා සාම්ප්‍රදායික ප්‍රාග්ධන සංකල්පයන් තවදුරටත් රැකියා හා කර්මාන්ත ලෝකයේ ප්‍රබලම ප්‍රාග්ධනය වන්නේ නැත. ප්‍රබලම ප්‍රාග්ධනය ළඟා කරගත හැකි වනුයේ ධනාත්මක මනෝ විද්‍යා ගුණය සහිත නව ශක්තිමත් මානව ප්‍රාග්ධනයක් බිහි කර ගැනීමෙන් පමණි. ඒ පිළිබඳව අපගේ අවධානය යොමු විය යුතු කාලය එළඹ ඇත.





# මෘදු කුසලතා රැකියාවට හා ජීවිතයට

**නිරංජලී ඩී. වික්‍රමසිංහ**
**උපදේශක/පුහුණුකරු**
MBA-USQ(Australia), PGC-HRM-USQ(Australia), MABE(UK), NLP(Practitioner & Coach), Gold & Silver Medal(LAMDA) Verse & Prose, Advanced Diploma in Teaching, Training, Assessing Learning-City & Guilds(UK)

අද සිටින තරුණ තරුණියන් ලොව පුරා විවෘත වන රැකියා අවස්ථාවන් ග්‍රහනය කර ගැනීමට තරම් ඉලක්ක ගතයි. යායුතු දිශාව පිළිබඳ ඔවුනට අවබෝධයක් තිබේ. බොහෝ විට ඔවුන් දැනුමින් සන්නද්ධයි. නමුත් දැනුම පදනම් කරගත් ලෝකයක බොහෝ දෙනා සතු සුදුසුකම් සමානයි. දැනුමින් අධ්‍යාපන සුදුසුකම්වලින් සමාන වුවත් වෙනස ඇති වන්නේ පුද්ගලයා සතු මෘදු කුසලතාවයන් (Soft skill) තුළිනි. මෘදු කුසලතාවයන් ආයතනික, සමාජීය, කටයුතු සේම තමාගේ සංවර්ධනය සඳහා කෙතරම් දුරට උපයෝගි කරගන්නේ ද යන්න මතයි.

මෘදු කුසලතා යනු සන්නිවේදනය, නායකත්වය, සුභවාදී ආකල්ප වැනි පුරුදු සමුහයකි. පුද්ගල ගති ස්වභාවයකි. පාසලේදී, නිවසේදී, විවිධ කටයුතු වලදී අවුරුදු ගණනාවක් තුළ එකතු කරගත් කුසලතා සමුහයකි. කුඩා කළ සිට පුරුදු පුහුණු කරගත් පුරුදු සමූහයක් වුවත් ඔබගේ කැපවීම, උනන්දුව තිබේ නම්, රැකියාව කරන අතරතුර වුවත්, මෙම මෘදු කුසලතාවයන් සංවර්ධනය කර ගැනීමේ හැකියාව පවති. ඔබ එයින් දියුණු කරගත යුතු මෘදු කුසලතාවයන් කිහිපයක් පහත සඳහන් වේ.

**ස්වයං අභිප්‍රේරණය හා සුභවාදී ආකල්ප**

සේවා ස්ථානයේදී ඔබගේ සුභවාදී ආකල්පයන්ට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක්, සේවා යෝජකයින් (Employer) ඔබ ගෙන් 100% සේවාවක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. ඔවුන්ට 100% සේවාවක් ලබාදීමට නම්, 200% දායකත්වයක් ඔබ ආයතනයට ලබා දිය යුතුයි. එවන් දායකත්වයක් ලබාදීමට නම් ඒ සඳහා ලොකු කැප කිරීමක්. ස්වයං අභිප්‍රේරණයක් තිබිය යුතුයි. ස්වයං අභිප්‍රේරණයක් සහිත පුද්ගලයාට වැඩ කරද්දි සෘජු අධීක්ෂණයක් අවශ්‍ය නැත. අධීක්ෂණයක් තිබුණත් නැතත් ඔවුන් කැපවීමෙන් සේවය කරයි. තමන්ගේ ජීවිතය සේම ආයතනයක් ඉදිරියට ගෙන යාම පිළිබඳව යහපත්



ආකල්පයන් ඔවුන් සතුයි. ආයතනයේ කැපවීමෙන් වැඩ කිරීම යනු සිටින තැනින් ඉහළට යාම සඳහා ඔබට ලබා දෙන අවස්ථාවකි. අපේ බොහෝ තරුණ තරුණියෝ රැකියාවට ගිය පසු යම් යම් සීමාවන් හදා ගෙන ඒ ඔස්සේ වැඩ කරන අවස්ථා සුලභයි. මේ කාර්යය මට කරන්න බැහැ. මෙය මගේ සීමාවෙන් පිටත තිබෙන දෙයක්. මට අයිති නැති රාජකාරියක් ලෙස සීමාවක් හදා ගනිමින් කටයුතු කිරීම සුදුසු නැත. මන්ද ඔබ සේවා ස්ථානය තුළ දී කරනු ලබන ලොකු කුඩා සෑම කටයුත්තක් තුළින්ම ඔබේ කුසලතා දියුණු වේ.

තමන් කරන්නේ කුමන කාර්යයක්ද ඒ තුළින් සංවර්ධනය වීමේ අවශ්‍යතාවය, කැපවීම ඔබ සතු විය යුතුයි. ඒ කැපවීම සුභවාදී ආකල්පයන් ඔබේ හිත ඇතුලෙන්ම පැමිණිය යුතුයි. කාර්යාලයේ කරන සෑම කාර්යයක්ම ඔබ සිටින තැනින් ඉහළට යාම සඳහා ඔබට ලබා දෙන්නේ මහඟු අවස්ථාවක්. ඔබ එම අවස්ථාවන්ට විවෘත වීම අත්‍යවශ්‍යයි. සාර්ථකත්වයේ රහස එයයි. පොතපතකින් ලබාගත නොහැකි බොහෝ අත්දැකීම් ප්‍රමාණයක් ඔබට වැඩ කිරීමෙන් ලබා ගත හැකියි. මේ ලබා ගන්නා අත්දැකීම් තුළින් ඔබේ කුසලතාවන්ට, ඔබේ සුදුසුකම් වලට ලොකු ගැඹුරක් ලැබේ.

### සන්නිවේදන හැකියාව

සන්නිවේදන හැකියාව ඇති පුද්ගලයා ආයතනය තුළ මනා ලෙස සබඳතා ගොඩනඟයි. කතාව, ලිවීම, ඇහුන්කන් දීම පමණක් නොව ආවාචික සන්නිවේදනයත් සන්නිවේදනයට අයත් වේ. පිරිසක් ඉදිරිපිට කතා කිරීමේ හැකියාව, (Presentation Skill) සාකච්ඡාවලට සම්බන්ධ වෙමින් සාකච්ඡා කිරීමේ හැකියාව (Negotiation Skill) ආයතනයක කටයුතු කිරීමේදී අත්‍යවශ්‍ය වේ. සන්නිවේදනයේ දී, දෙඇස් දෙස ඍජුව බලා කතා කිරීමේ හැකියාව (Eye Contact), ශාරීරික භාෂාව භාවිතා කිරීම (Body Language), ආදිය ද ඔබ වර්ධනය කරගත යුතු කුසලතාවන්ය.

### සන්නිවේදනයේ ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම

වෘත්තීය සංවර්ධනය ලබා ඉදිරියට යාමට පමණක් නොව රැකියා ගත වීමේදී ද සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි භාෂාව ඉතා වැදගත් වේ. බොහෝ දෙනා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අවධානය යොමු කරන්නේ වැඩ ලෝකයට පිවිසෙන කාලයේදියි. නමුත් කුඩා කාලයේ බහුවිධ භාෂාවන් ඉගෙනීම හැකියාව දරුවන්ට තිබෙනවා. මෙම අවස්ථාවන් මඟහරින බොහෝ දෙනාට ඉංග්‍රීසි භාෂාව මතක් වන්නේ රැකියා ලෝකයට ඇතුළත් වන කාලයේදී. එනිසා කුඩා කාලයේ සිට ඉංග්‍රීසි ලිවීමේ කියවීමේ, කතා කිරීමේ හා ඇහුන්කම්දීම ඇසුරෙන් ඉංග්‍රීසි භාෂා නිපුණත්වය ලබා ගත යුතුයි. පොතපත කියවීම, ඉංග්‍රීසි චිත්‍රපට බැලීම, කතා කිරීම වැනි දේ තුළින් ඉංග්‍රීසි භාෂාව ඔබේ ජීවිතයේ කොටසක් බවට පත් කර ගත හැකියි.

### සාකච්ඡා පැවැත්වීමේ කුසලතාවය (Negotiation Skill)

ආයතනයක සේවය කිරීමේදී ආයතනයේ කාර්ය මණ්ඩලයට සිය සේවාලාභින් සමඟ නිරන්තරව කතා කිරීමට, සාකච්ඡා කිරීමට සිදුවේ. සාකච්ඡාවෙන් තීරණ ගැනීමේදී තමන්ට වාසි වන පැත්ත පමණක් බලා තීරණවලට එළඹීම සුදුසු නොවේ. තමන්ට වාසියක් ලැබෙන, ආයතනයටත් වාසියක් ලැබෙන, සිය සේවාලාභීන්ටත් වාසි ලැබෙන ආකාරයටයි සාකච්ඡා කොට තීරණ ගත යුත්තේ. මෙය ඔබටත් ඔබ සේවය කරන ආයතනයටත්, ඔබේ සේවාලාභීන්ටත් යන සෑම දෙදෙනාටම වාසි ජයග්‍රහණ ලැබෙන ලෙස කටයුතු කිරීමකි. (Win win Situation) සාකච්ඡාවකදී සිදු වන අනවශ්‍ය ගැටුම් මග හරවා ගැනීමේ හැකියාව ද මේ තුළින් ලැබේ.

### තීරණ ගැනීමේ කුසලතාවය

අපේ තරුණ තරුණියන් තීරණ ගැනීමේදී බාහිර පාර්ශවයන් මත රැඳෙන තත්ත්වයක් දක්නට ලැබේ. ඔවුන් විසින් ගත යුතු තීරණ බොහෝ විට ගනු ලබන්නේ දෙමව්පියන් විසිනුයි. දෙමව්පියන් අප පසු පසින් සිටිය යුතු නමුත් ඔබේ තීරණ ගත යුත්තේ ඔබ විසිනුයි. නැතිනම් ඔබ හැමවිටම අන් අය මත යැපෙන පුද්ගලයෙකු බවට පත්වේ. යම් යම් සිද්ධීන් වලදි අවස්ථාවන්වලදි තීරණ ගැනීමේ දී ඒ තුළ සිට තීරණ ගැනීමෙන් තමාටත් අන් අයටත් සිදුවන්නේ අවාසියක්. අප ගැටළුවේ සිර වී සිටියහොත් බොහෝ විට චිත්තවේගී තත්ත්වයන් අනුව, අපට සාපේක්ෂ ලෙසටයි තීරණ ගන්නේ. එහිදී අපට හරි වැරැද්ද පිළිබඳ වැටහීමක් ඇති නොවේ. නමුත් ගැටළුවෙන් පිටතට විත් ගැටළුව සමස්ථයක් ලෙස බලමින් (Helicopter View) කරුණු, දත්ත පදනම් කර ගනිමින් සාකච්ඡා කිරීමේ හැකියාව, තීරණ ගැනීමේ හැකියාව තිබිය යුතුයි. එසේ නැතිනම් තෙවන පාර්ශවයක ඇසින් සිද්ධිය හෝ ගැටළුව දෙස බැලීමේ හැකියාව තිබිය යුතුයි. ඒ තුළින් සැමට සාධාරණයක් වන ලෙස තීරණ ගැනීමේ හැකියාව ලැබේ.

### ඉදිරිපත්කිරීමේ කුසලතා (Presentation Skill)

ඔබේ ප්‍රතිරූපය ඉතා හොඳින් නිරූපනය වන පරිදි ඔබට ඔබ ගැන කතා කළ හැකිද? ඔබ අන් අයට ඔබේ අදහස් ඉදිරිපත් කරන්නේ කෙසේද? සාකච්ඡා කරන්නේ කෙසේද? මාතෘකාවට අදාළ ලෙස

ප්‍රශ්න ඇසීමේ හැකියාවක් ඔබට තිබෙනවාද? ආදී සියල්ලම අයත් වන්නේ ඉදිරිපත් කිරීමටයි. එමනිසා ඔබ ඔබගේ අදහස් ඵලදායී ලෙස ඉදිරිපත් කල යුතුය. මහජනයා ඉදිරියේ කතා කිරීමේ හැකියාව වර්ධනය කර ගත යුතුයි.

**සහයෝගීතාවය (Team Work)**

ආයතනයක කටයුතු සිදුවන්නේ සාමූහිකවයි. එහිදි කණ්ඩායමේ සාමාජිකයෙක් ලෙස කණ්ඩායමේ අන් සාමාජිකයින් සවිබල ගැන්වීමේ හැකියාව, සාමාජිකයින් ඉලක්කය වෙත ගෙනයාමේ හැකියාව. ඔබ සතු නම් එය සුවිශේෂී හැකියාවකි. ආයතනයකට අවශ්‍ය වන්නේ සියළු දෙනාගේ සහයෝගය ලබා ගනිමින් කණ්ඩායමේ අන් සාමාජිකයින්ගේ දක්ෂතා, කැපවීම භාවිතා කරමින් ආයතනය ඉහළට ඔසවා ගෙන යා හැකි ආයතනික අරමුණු වෙත ප්‍රවේශ විය හැකි පුද්ගලයින්ය.

**ප්‍රතිරූපය ගොඩනගා ගැනිම (Rapport Building)**

ඔබ යම් භාණ්ඩයක් හෝ සේවාවක් අලෙවි කරන විට එම භාණ්ඩයට හෝ සේවාවට පෙර පළමුවෙන්ම ඔබ විසින් ඔබවයි අලෙවි කරන්නේ (People buy people not product). ඉන් අදහස් වන්නේ භාණ්ඩය හෝ සේවාව විකිණීමට පෙර මිනිසුන් සමග ඔබට සම්බන්ධතා ඇති කර ගැනීමට සිදු වේ. විවිධ තලයන්වල මිනිසුන් සමග මිත්‍රශීලී සබඳතා ගොඩනගා ගැනීමට සිදු වේ. ඒ සඳහා මිනිසුන් තුළ ඔබ පිළිබඳව සුභවාදී ප්‍රතිරූපයක් ඇති කළ යුතුයි. සුභවාදී ප්‍රතිරූපයක් ඇති කර ගැනිම සඳහා ඔබට මිනිසුන්ට සංවේදී වීමට සිදු වේ.

**සහකම්පනය (Empathy)**

ඇතැම් විට අප වෙත එන මිනිසුන්ට බොහෝ ප්‍රශ්න තිබිය හැකියි. එනිසා ඔවුන්ව තේරුම් ගැනීම. ඔවුන්ගේ සපත්තුවට බැස එසේ නැතිනම් ඔවුන්ගේ පැත්තේ සිට ඔවුන් සිටින තත්ත්වය තේරුම් ගැනීමට කෙතරම් දුරට ඔබට හැකිද? ඔබට එලෙස සංවේදීව මිනිසුන් තේරුම් ගත හැකි නම් මිනිසුන් දිනා ගැනීමේ හැකියාව ඔබ සතුයි. අන් අයගේ සිත් තුළ ඔබ පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ගොඩනැගීමට ඔබ සමත්.

**නිරන්තර අලූත් වීම/යාවත්කාලීන වීම. (Countinuous Development)**

අද හැමදේම ඔබේ අත ලඟ. අද ඔබේ ලඟම මිතුරා අන්තර්ජාල පහසුකම් සහිත ජංගම දුරකථනයයි. (Smart Phone) බොහෝ දෙනෙක් ජංගම දුරකථනය යොදා ගන්නේ ඇමතුම් ලබා ගැනීමට අමතරව සිංදු අහන්නයි, ඕප දූප බලන්නයි. නමුත් ඔබේ දුරකථනය පවා ඔබේ දියුණුවට යොදා ගත හැකියි. වාහනයක ගමන් කරන කාලය ඔබේ දියුණුවට යොදා ගත හැකියි. (University on wheels) You tube හරහා ඔබට අවශ්‍ය බොහෝ දේ ලබා ගත හැකියි. පොත් පුවත්පත් කියවීම ඔබ දියුණු වන අනෙක් මාර්ගයයි. වර්තමානයේ අන්තර්ජාලය හරහාත් පොත් ගෙන කියවිය හැකියි. ඔබේ ජංගම දුරකථනය හෝ ටැබ්ලටය (Tablet) ඔබේ විනාශයට යොදා ගන්නවාද නැතිනම් එය අපව සංවර්ධනය කරන මෙවලමක් (Tool) කර ගන්නවාද යන්න තීරණය කළ හැක්කේ තරුණ ඔබටයි.

එසේම ඔබේ දේශපාලන දර්ශනය කුමක් වුවත් රටේ ලෝකයේ වර්තමාන දේශපාලන සමාජ ආර්ථික ප්‍රවනතාවයන් පිළිබද දැනුම අත්‍යාවශ්‍යය. මිනිසුන් හා සම්බන්ධතා පැවැත්වීමේදී ඔවුන් සමඟ සුහද කතාවකට (Ability to have small talk) යාමට ඔබට හැකියාව ලැබෙනවා. එනිසා ඔබ යම් යම් දේ පිළිබඳව සරලව දැනගෙන සිටීම වැදගත්. නමුත් මතක තබා ගතයුතු වැදගත්ම දේ වන්නේ සමීපතමයන් ඉදිරියේ හැර දේශපාලනය, ජාතිය, ආගම වැනි දේ පිළිබඳව අදහස් ඉදිරිපත් නොකිරීමට පරෙස්සම් විය යුතුයි. මන්ද මේවා ඉතාම පෞද්ගලික දේවල්. මිනිසුන්ගේ චිත්තවේග හා බැඳුණු යුද්ධ ගැටුම් පවා ඇතිවීමට හේතු වන කතාවන්.

**නිශ්චිත ජීවිත අරමුණක් තිබීම. (Targeted Life Goal)**

ඔබේ හැකියාවන්, ශක්තීන් හඳුනා ගෙන ඊට අනුකූලව ඔබගේ ජීවිතයේ වෘත්තීය, අධ්‍යාපන, පෞද්ගලික අරමුණු සකස් කරගැනීම ජීවිත සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වේ. නමුත් අරමුණක් යනු අනාගතය පිළිබඳව ඇති බලාපොරොත්තුවක් පමණක්ම නොවේ. අරමුණු පිළිබද හැමවිටම සිතිය යුත්තේ ධනාත්මක ලෙස වර්තමාන කාලයෙනුයි. අරමුණක සාර්ථකත්වය තිබෙන්නේ වර්තමානයේ ඔබ ඒ තුළ ජීවත් වීමෙනුයි. අනාගතයට අරමුණු දී සිටියහොත් එය ඔබේ හිතට දෙන්නේ සෘණාත්මකවයි. ඒ නිසා අපේක්ෂිත තත්ත්වය පිළිබද වර්තමානයෙන් සිතන්න.

එසේම සියලු පීඩාවන් අතරින් ලැබූ සාර්ථකත්වය පවත්වා ගන්න. ජීවිත සාර්ථකත්වය සඳහා ඔබේ ජීවිතයට මඟපෙන්වන ඔබගේ හැකියාවන් දුර්වලතාවයන් තේරුම් ගත් විශ්වාසවන්ත පුද්ගලයෙකුගේ (Mentor) මඟ පෙන්වීම ලබා ගන්න. මන්ද ඔබගේ සාර්ථකත්වය පිළිබද ඔබට නොපෙනෙන බොහෝ දේ පිළිබද අවබෝධයක් එවැනි මඟ පෙන්වන්නෙකුට තිබේ. එනිසා ලබාගන්නා මඟපෙන්වීම් ඔබේ. ජීවිත සාර්ථකත්වයට එය ඉතා වැදගත් වනු ඇත.



**පෞරුෂය කැපී පෙනෙන ලෙස ඇඳීම. (Grooming)**

ගැළපීමකින් යුතුව අඳින පළඳින ආකාරය ඇවිදින ආකාරය පිළිබඳ වැටහීමක් ඔබට තිබිය යුතුයි. ඔබගේ පෞරුෂත්වය ඉස්මතු වන ලෙස ඇඳුම් පැළඳුම් තෝරාගෙන සූදානම් වීම පිළිබඳ ඔබට අවබෝධයක් තිබිය යුතුයි. සහභාගි වන අවස්ථාව, ආයතනික සංස්කෘතිය ආදියට සැලකිල්ලක් දක්වා ඒ අනුවයි සූදානම් විය යුත්තේ. නැතිනම් එය ඔබ විසින්ම ඔබටම කරගන්නා හානියක් වනු ඇත.

**ආතති කළමනාකරණය (Stress Management)**

ආයතනය ඔබෙන් ඉහළ දායකත්වයක්, කැපවීමක් බලාපොරොත්තු වේ. ඉහළ අපේක්ෂාවන් සහිත තත්ත්වයක සේවය කරන විට ඔබට නිරන්තර ආතති තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවේ. ආතතිය හා අධික වැඩ තුළ පැටළුණු නූල් බෝලයක තත්ත්වයට වුවත් පත්වීමේ ඉඩ කඩ පවතී. මෙවැනි තත්ත්වයක් වුවහොත් එය අපේ විනාශයට වැටීමට හේතු වේ. එම නිසා පීඩන තත්ත්වයන් යටතේ වුවත් මනා සිහියෙන් හා (Mindfulness) සන්සුන් මනසකින් යුතුව ඔබේ කටයුතු සඳහා සම්පූර්ණ අවධානය යොදන්න. ඉදිරිය දෙස බලා කටයුතු සැලසුම් කරන්න. නමුත් අද ඔබට කිරීමට ඇති දේ මනා සිහියෙන් යුතුව අදම කරන්න. ඔබව සන්සුන් කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ ඔබ හඳුනාගත යුතුයි. මේ සඳහා ඔබේ පහසුවට සරලව භාවනාවක්, ගීත ශ්‍රවනය කිරීම, ස්වභාව ධර්මය ඉහතින් සඳහන් කළ මෘදු කුසලතාවයන් ඔබේ වෘත්තීය රසවිඳීම ආදී ක්‍රමක් හෝ තමාට පහසු ක්‍රමයක් සකස් කර ගත යුතුයි.

ජීවිතයටත් පෞද්ගලික ජීවිතයටත් අදාළ වන අකාරය දැන් ඔබට වැටහෙනවා ඇති. සැබවින්ම ඔබ කළ යුත්තේ මේ කුසලතා අද අද ම ඔබ තුළ වර්ධනය කරගැනිමට ක්‍රියා කිරීමයි. එමගින් ඔබට වෘත්තීය ජීවිතයත්, පුද්ගලික ජීවිතයත් සාර්ථක කර ගත හැකියි.




කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂිත තරුණ තරුණියන් සඳහා පැවැත්වූ "ඔබ අසිරිමත්ය" වැඩමුළුවේ මතක සැමරුම්

# කුසලතා රැසකින් අපූර්ව සංකල්පනයක් සඳා ජීවිතයේ මුදුන්හිනිපෙත්තටම නැගී කිෂූ.....



වයස අවුරුදු 19න් අලෙවිකරණ ක්ෂේත්‍රයට පිවිස අවුරුදු 35 වන විට අන්තර් ජාතික සමාගමක ප්‍රධාන විධායක නිලධාරියෙකු බවට පත් වූ ලාබාලතම ශ්‍රී ලාංකිකයා වීමට වාසනාවන්ත වූ අපූර්ව වෘත්තීයවේදියා කිෂූ ගෝමස්. අනාගතයේ විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන්ට පිවිසීමට සිහින දකින තරුණ ඔබට මෙය තවත් එක් කථාවක් නොව ජීවිතයට මාහැඟි ආදර්ශයන්, ආලෝකයක් ලබා ගත හැකි අත්දැකීම් රාශියකි.

**වර්තමානයට පසුබිම් වූ අතීත කථාව ඔහුගේම වචන වලින්.............**

මම ඉපදුනේ මාතර. මගේ මුල් පාසල මාතර සර්වේසස් විද්‍යාලය ඉන්පසුව මොරටුවේ වේල්ස් කුමර විද්‍යාලයටයි ඇතුළත් වුනේ. පොඩිකාලේ මගෙ පෙනුම, හුරුබුහුටිකම, දක්ෂතා නිසා මම ආකර්ශනිය චරිතයක්. ගුරුවරු හැමදෙනාම මට ආදරය කළා. මට ඒ හැඟීම හරිම සුවිශේෂියි. එනිසා පොඩි කාලේ සිට අන් අයගේ ගරුත්වය, ආකර්ශනය දිනා ගන්නයි මම යොමු වුණේ. පාසල් කාලයේදී මම ක්‍රීඩාවන් 13 කට පමණ සම්බන්ධ වුණා, කැඩෙට්න් කළා. ඒ කාලයේ පුහුණු කරුවන් හරි විරලයි. ක්‍රීඩා පිලිබඳ මට තිබූ දක්ෂතාවය, තාක්ෂණික දැනුම නිසා පාසල් යන කාලයේම ක්‍රීඩා පුහුණු කරන්න, විනිශ්චය කරන්න ආරාධනා ලැබුණා.

ගීත ගැයීමේ හා, චිත්‍ර ඇඳිමේ දක්ෂතාත් තිබුණා. ඊට අමතරව විවිධ සමිති සමාගම්වල නිලතල දැරුවා. නායකත්වය ගත්තා. නායකත්වය මට හුරු වුනේ පාසල් කාලයේදීමයි පාසල් කාලයේ පාසල් ශිෂ්‍යයෙක් ලෙස කොටු වී නොසිට පාසලෙන් පිට නායකත්වය දෙන පුද්ගලයෙක් බවට මම පත් වුණා. නායකත්වය දෙන්න, වෙනස් දෙයක් කරන පුද්ගලයෙක් වෙන්න, අන් අය තුළ මා පිළිබඳව තිබෙන ආකර්ශනය දිගටම පවත්වා ගෙන යන සුවිශේෂ පුද්ගලයෙක්, වෙන්නයි පොඩි කාලයේ සිට මට අවශ්‍ය වුණේ.

මම උසස් පෙළට පෙනී සිටියේ ගණිත විෂය ධාරාවෙන්. ඒ උනත් විශ්ව විද්‍යාලයට යන්න කියලා මට ලොකු උනන්දුවක් තිබුනේ නැහැ. මට උවමනා උනේ විශේෂ අයෙකු වීමට. ජයග්‍රාහකයෙකු (Winner) හැටියට ඉදිරියට යාමට ඒකට ගැළපෙන සමාජයේ වැදගත් කියලා පෙනෙන රැකියාවක් සොයා ගන්න හිතුවා.

**ඒ සඳහා ඔබ තෝරාගත් රැකියා ක්ෂේත්‍රය පිළිබඳ විස්තරයක් කලොත්.......**

ලස්සනට අඳින්න කැපී පෙනෙන්න තිබුන ආශාව නිසා කොකා කෝලා ආයතනයේ අලෙවිකරණයට (Sales) සම්බන්ධ වුණා. එතකොට මගේ වයස අවුරුදු 19 යි. රැකියාවට ඇති ආදරය හා කැපවීම නිසා අවුරුදු එකහමාරකට පස්සේ විධායක නිලධාරියකු ලෙස උසස් වීමට හැකියාව ලැබුණා. ඒ වගේම ඒ කාලයේදී CIM (අලෙවිකරණය පිළිබඳ වරලත් විභාගය) විභාගයෙන් සුදුසුකම් ලැබුවා. ඒ කාලයේ අලෙවිකරණ ක්ෂේත්‍රයේ (Marketing Field) CIM සුදුසුකමට තිබුණේ ලොකු පිළිගැනීමක්, හොඳ ඉල්ලුමක්. ක්ෂේත්‍රයේ දියුණු වීම, වෘත්තීය සංවර්ධනය ලබාගැනීම නිසා මට









ආයතනයෙන් හොඳ ප්‍රතිචාරයත් ලැබුණා. විදේශ සංචාර ලැබුණා. විදේශිකයින් සමඟ ආයතනික අත්හදා බැලීම් වලට සම්බන්ධ වුණා. එහෙම අවුරුදු 11 ක් මම කොකා කෝලා ආයතනයේ හිටියා. ඉන් පසුව කැල්ටෙක්ස් ආයතනයට සම්බන්ධ වුණා.

**ඉන් පසු ඔබගේ රැකියා භූමිකාව.......**

දැන් ප්‍රධාන විධායක නිලධාරී (CEO - Chief Executive Officer) වශයෙන් Chevron Lanka PLC වල සේවය කරනවා. විශේෂඥයන් සමග එක්ව චෙව්රෝන් ආයතනය විදේශීය ලිහිසි තෙල් කර්මාන්තයේ, ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉහළ ස්ථාවරත්වයක් ඇති (Blue Chip) සමාගමක් බවට පත් කිරීමට හැකි වුණා. Chevron ආයතනයට අමතරව මම ඇමරිකානු වාණිජ මණ්ඩලයේ හිටපු සභාපති කෙනෙක්. මගේ නායකත්වය යටතේ ඇමරිකානු වාණිජ මණ්ඩලය 2003 වර්ෂයේදී හොඳම මූල්‍ය ප්‍රතිඵල වාර්තා කර ගත්තා.

**සංගීතයට, චිත්‍රවලට කලා ක්ෂේත්‍රයට ඔබගේ තිබූ නැඹුරුව ජීවිතයට යොදාගන්නේ කෙසේද?**

මට ගැළපෙයි යැයි හැඟෙන දෙයින් නිරූපණ ක්ෂේත්‍රයේ කටයුතු කරනවා. ඊට අමතරව කලා හා විලාසිතා තරඟවල විනිශ්චය කරුවෙකු වශයෙන් ද කටයුතු කරලා තියෙනවා. එසේම Sunday Observer පුවත් පතේ Biz talk by Kishu තේමාව යටතේ තීරු ලිපි පවත්වාගෙන යනවා.

**ඔබ ජීවිතය ජය ගත් කෙනෙක් නව පරපුරට ඔබ දෙන උපදෙස් මොනවාද?**

Bill Gates කරපු දේවල් කෙරුවට තව Bill කෙනෙක්ම වෙන්න ඔබට බැහැ. තමන් සුවිශේෂී (Unique) පුද්ගලයෙකු වෙන්න. කාවවත් අනුගමනය කරන්න එපා. සාර්ථකත්වයට ඉවහල් වන දේ පමණක් සාර්ථක, අසාර්ථක වූ හැමදෙනාගෙන්ම ඉගෙන ගන්න. දිනන්නට කැමැත්තක් ඇති කර ගන්න. ජය, පරාජය යන දෙකින්ම ඉගෙන ගන්න. උපරිමය කරන්න. බුද්ධිය, දැනුම, තාක්ෂණය, නිර්මාණශීලීත්වය තමන් තුළ ඇති කරගන්න.

ක්‍රීඩාව, කලාව ආදී බහුවිධ කුසලතාවන් තම වෘත්තීය ජීවිතයට එකතු කරගැනීම නිසා ඔහු සුවිශේෂී විය. විටෙක ඔහු බැරෑරුම් කටයුතු කරන විධායක නිළධාරියෙකි. විටෙක මෝස්තර නිරූපන ශිල්පියෙකි. විටෙක කථිකයෙකි. විටෙක ලේඛකයෙකි. විටෙක ගායකයෙකි. ඔහු තුළ තිබෙන මේ සංකලනය නිසා ඔහු හා සම කළ හැකි කිසිම විධායක නිළධාරියෙකු නොමැති තරම්ය.

පාසල් කාලයේ ඔබ කරන සියලු දේ, ඔබගේ බහුවිධ කුසලතාවයන් වෘත්තීය ජීවිතයට එකතු කර ගත් විට ඉන් අපූර්ව වූ සංකලනයක් ඇති වේ. එය ඔබගේ සුවිශේෂීත්වයට හේතු වේ. කිෂු ගෝමස් වෘත්තීයවේදියා ගෙන් අපට ලබාගත හැකි ආදර්ශය එයයි. ඔහුගේ සාර්ථකත්වයේ රහස එයයි.



**සකස් කළේ**
**අරුණ විජේසේකර**
**මානව සම්පත් සංවර්ධන නිලධාරී**

# කඩුව හොඳින් මුවහත් කරගැනීමට නම්.....




**ධනුෂ්ක එස්.කුලතිලක**
PhD(Reading), MBA(Distinction,Aus.),
PGD in Business Mgt(Aus.),
BSc (1st Class, Teaching Technology),
BA,FCMI(UK),FABE(UK), MIM(SL)
Lecturer - Sadana Language Centre
Hokandara

වර්තමානයේ ලොව පුරාම ඉංග්‍රීසි අධ්‍යාපනයට ඇත්තේ විශාල ඉල්ලුමකි. එයට හේතුව වන්නේ අධ්‍යාපනයේදී, ව්‍යාපාර කටයුතුවලදි පමණක් නොව එදිනෙදා කටයුතුවලදි පවා ඉංග්‍රීසි භාෂාව නැතුවම බැරි භාෂාවක් බවට පත්ව තිබීමයි. එම නිසා ඉංග්‍රීසි භාෂා නිපුණත්වය ලබා ගැනීමට වෙහෙසීම අනාගත වෘත්තීය සංවර්ධනය පිළිබඳ සිතන කාගෙත් වගකීමක් විය යුතුය.

ශ්‍රී ලංකාවේ අපේ දරුවෝ පාසලේ පළමු පංතියේ සිට උසස් පෙළ දක්වා විෂයයක් ලෙස ඉංග්‍රීසි භාෂාව හැදෑරුවත්, පාසලෙන් ඉවත් වූ පසුවත්, ඉංග්‍රීසි පාඨමාලාවන්ට යාම සුලභ දර්ශනයකි. ඉංග්‍රීසි භාෂාවෙන් නිසි ලෙස සන්නිවේදනය කළ නොහැකි නිසා බොහෝ ළමුන්ට අධ්‍යාපන, වෘත්තීය පාඨමාලා හැදෑරීමේදීත්, රැකියාවන්ට ප්‍රවේශ වීමේදීත් මහත් අභියෝගයන්ට මුහුණ දීමට සිදු වේ. මෙම තත්ත්වය දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට පමණක් නොව වෘත්තීය සංවර්ධනයට ද බලපෑම් එල්ල කරයි. ඒ නිසා නව ලොවට පිවිසෙන දරුවන්, අනාගතය පිළිබඳ සිතා නිපුණත්වය ලැබෙන පරිදි භාෂා හැකියාව දියුණු කරගැනීම ඉතා වැදගත් වේ.

පළමු පංතියේ සිට ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස ඉගෙන ගත්තත් ඉංග්‍රීසි භාෂා නිපුණත්වය ඇති නොවන්නේ සිසුන් වැඩි ප්‍රමාණයක් මුහුණ දෙන අ.පො.ස (සා.පෙ) විභාගයේදී පවා වැඩිපුරම පරීක්ෂා කරනු ලබන්නේ කියවීම (READING), ලිවීම (WRITING) ආශ්‍රිත දැනුම පමණක් වීමයි. නමුත් ඉංග්‍රීසි භාෂාව පමණක් නොවේ වෙනත් ඕනෑම භාෂාවක් ප්‍රගුණ කිරීමේදී කියවීම, ලිවීම, සවන් දීම හා කතාව යන අංශ 04 ම ඉතා වැදගත් වන අතර මෙම අංශ 04ම භාෂාවක් ප්‍රගුණ කිරීමේ දී ආවර්ණය විය යුතුය. එය භාෂාවක් අධ්‍යයනයේදී සැලකිලිමත් විය යුතු වැදගත්ම කරුණකි. එසේම ඉංග්‍රීසි භාෂා පාඨමාලා හැදෑරීමේදී, ඔබගේ අනාගත අරමුණු, ඔබගේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමත් ඉතා වැදගත් වේ. අනාගතය පිළිබඳ ඔබට බොහෝ සිහින තිබිය හැකියි. ඇතැම් විට අධ්‍යාපනය හා වෘත්තීය පිළිබඳ ඔබේ සිහින මෙරට පමණක් නොව ජාත්‍යන්තරය හා බැඳුණු ඒවා විය හැකියි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලැබීම, වෘත්තීය සංවර්ධනය ලබා ගැනීම විදේශීය විශ්ව විද්‍යාලවලට පිවිසීම, ස්ථිර හෝ තාවකාලීක පදිංචියට යාම ආදී අරමුණු කුමක් වුවත් එම අවශ්‍යතාවයන් සපුරා ගත හැකි වන පරිදියි අපේ වර්තමාන පසුබිම සකස් කරගත යුත්තේ. එවිට බාධාවකින් තොරව ඔබේ අනාගත අරමුණු කරා ඔබට ප්‍රවේශ විය හැකියි.

ඔබගේ අනාගත අරමුණු විදේශීය රටවල් හා බැඳුණු ඒවා නම් පාඨමාලා හැදෑරීමේදී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැළපෙන පිළිගැනීමක් ඇති පාඨමාලා හැදෑරීම වැදගත් වේ. මන්ද ඒ

තුළින් අදාළ ව්‍යාපාරික, අධ්‍යාපන ආයතන වලට ඔබේ ඉංග්‍රීසි භාෂා නිපුණත්වයේ මට්ටම අවබෝධ කරගත හැකියි. එසේ ඉංග්‍රීසි භාෂා නිපුණත්වය ලබා ගත හැකි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැළපෙන විදේශ විශ්වවිද්‍යාල මඟින් පවත්වා ගෙන යනු ලබන ඉංග්‍රීසි පාඨමාලාවන් පිළිබඳ හඳුන්වා දීම මෙම ලිපියේ අරමුණයි.

Assesstment විභාග වලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ක්‍රමානුකූලව තමන්ගේ දැනුම් මට්ටමේ සිට මෙම පාඨමාලාව හැදෑරීම මඟින් කියවීම, ලිවීම, සවන් දීම හා කතාව යන අංශ 04 ආවරණය වන පරිදි ඉංග්‍රීසි භාෂා නිපුණත්වය ලබා ගත හැකි වේ. මෙම විභාග සකස් කොට ඇත්තේ විවිධ රටවල විවිධ භාෂා කතා කරන පිරිස් අරමුණු කොට ගෙනය.

පාඨමාලා හා වෘත්තීන්ට බඳවා ගැනීමේදීත්, වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමේදී මෙම සුදුසුකම පිළිගනී. විශේෂයෙන් මෙම විභාග ඉංග්‍රීසි භාෂා හැකියාවෙහි ප්‍රමිතින් ජාත්‍යන්තරව විස්තර කෙරෙන භාෂාව පිළිබඳ පොදු යුරෝපීය රාමුව මත සකස් වී ඇත.




විදේශීය අධ්‍යාපනය ලැබීමේදී හා වෘත්තීයන්ට ප්‍රවේශ වීමේදී සලකා බැලෙන ජාත්‍යන්තර මට්ටමේ විභාගයන් වේ. TOFEL"/ IELTS"/ Cambridge English"' යන විභාගයන් ඒ අතර ප්‍රධාන වේ. විශේෂයෙන් TOFEL" IELTS විභාග යනු විදේශ ගත වීමේදී ස්ථිර හෝ තාවකාලික පදිංචියට යාමේදී හෝ උසස් අධ්‍යාපනය සඳහා අවශ්‍ය වන සුදුසුකමකි. මෙහි වලංගුතාවය අවුරුද්දක් පමණ වන අතර ලකුණු ප්‍රමාණය තීරණය වන්නේ අදාළ රටේ හෝ අදාළ අධ්‍යාපන ආයතනයේ නියමයන්ට අනුවයි.

කුඩා කාලයේ සිට වැඩිහිටි අවධිය දක්වාත්, විවිධ වෘත්තීමය අවශ්‍යතා අනුවත් භාෂා නිපුණත්වය ලබා ගත හැකි ඉංග්‍රීසි භාෂා විභාග අතරින් Cambridge English Language Cambridge (English speaker for other Languages ESOL) මෙම විභාගයන්ට පෙනී සිටින්නන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය පළමු භාෂාව කුමක් වුවත් සමස්ථය ආවර්ණය වන පරිදි පාඨමාලාවන් සකස් කොට ඇත.

**Cambridge විභාග සමත් වීමෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ.**

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගත හැකියි. නිපුණත්වයෙන් යුතු ඉංග්‍රීසි භාෂා හසුරුවන්නෙක් බවට පත්විය හැකියි. මෙම විභාග ලොව පුරා බොහෝ රටවල ව්‍යාපාරික ආයතන, රාජ්‍ය ආයතන, විශ්වවිද්‍යාල හා අනෙකුත් අධ්‍යාපන ආයතන 20,000 ක් පමණ සිය අධ්‍යාපන (Common European Framework of Reference for Languages (CEFR). විශේෂයෙන්, ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, කැනඩාව වැනි රටවල වෘත්තීය හා අධ්‍යාපන අවස්ථාවන්ට ප්‍රවේශ වීමේදී මෙම සුදුසුකම් පිළිගනී.

මෙම විභාග අදියර ගණනාවකින් සමන්විත වේ. තමාට වඩාත් ගැළපෙන විභාගය කුමක් දැයි තීරණය කිරීම සඳහා අන්තර්ජාලය ඔස්සේ පැවැත්වෙන පරීක්ෂණවලට මුහුණ දී තමාට වඩාත් ගැළපෙන විභාගය කුමක්ද කියා තීරණය කිරීමේ හැකියාව පවති. තමාගේ තිබෙන ඉංග්‍රීසි භාෂා නිපුණත්වය මත විභාග වලට පෙනී සිට ඉදිරියට යා හැකියි.

කේම්බ්‍රිජ් විභාගයන් ප්‍රධාන වශයෙන් කොටස් 02කි. එනම්,

1)සාමාන්‍ය ඉංග්‍රීසි (General English)

2)වෘත්තීය ඉංග්‍රීසි (Professional English)

වශයෙනි. ඊට අමතරව මූල්‍ය ක්ෂේත්‍රයන්හි වෘත්තීන්හි නිරතවන්නන් සඳහා International Certificate in Financial English විභාගය ද නීති ක්ෂේත්‍රයේ වෘත්තීන්ට ප්‍රවේශ වීමට අපේක්ෂා කරන්නන් සඳහා International Certificate in Legal English විභාගය පවත්වනු ලැබේ. සාමාන්‍ය ඉංග්‍රීසි විභාගය අදියර 05 කින් සමන්විත වේ.

## සාමාන්‍ය ඉංග්‍රීසි (General English)

KET පාසල් යන ළමුන්ට ඉංග්‍රීසි භාෂා හැකියාව ලබා දෙන පාඨමාලාවකි. සරල පොත්, පුවත්පත් ලිපි කියවීම, එදිනෙදා ජීවිතයට අදාළ ප්‍රායෝගික සන්නිවේදනය, විවිධ ලිපි ලිවීමේ හැකියාව ලැබේ.

PET ඉංග්‍රීසි භාෂාවේ මූලිකාංග, සරල ලිපි කියවීම ඉංග්‍රීසි භාෂාව ලිවීමේ හැකියාව, සාකච්ඡාවල සටහන් ගැනිම, එදිනෙදා ජීවිතයට අවශ්‍ය ඉංග්‍රීසි භාෂා නිපුණත්වය ලැබේ. FCE ලොව පුරා ඇති අධ්‍යාපන, ව්‍යාපාරික ආයතනයන්හි පිළිගැනීමට පත්ව ඇති පාඨමාලාවකි. ඵලදායි ලෙස මුහුණට මුහුණ සන්නිවේදන හැකියාව, අදහස් මතවාද ඉදිරිපත් කිරිමට පැහැදිලි විස්තරාත්මක ලිපි වාර්තා ලිවීමේ හැකියාව ලැබේ.

CAE ආයතන, විශ්වවිද්‍යාල බලාපොරොත්තු වන ඉහළ මට්ටමේ පාඨමාලාවකි. විශ්ව විද්‍යාල පාඨමාලා හැදෑරීමට, වෘත්තීය මට්ටමින් ඵලදායි ලෙස සන්නිවේදනයේ යෙදීමට, සාකච්ඡා සම්මන්ත්‍රණ වලදී අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව, ව්‍යක්තව ඉංග්‍රීසි කතා කිරීමේ හැකියාව ලැබේ.

CPE ඉහළ ඉංග්‍රීසි භාෂා නිපුණත්වය. ව්‍යක්තව භාෂාව භාවිතා කළ හැකි අතර පශ්චාත් උපාධි, ආචාර්ය උපාධි කිරීමට, කළමනාකාරීත්ව මට්ටමේ සාකච්ඡා කිරීම සම්මන්ත්‍රණ වලට සහභාගී වීමේ හැකියාව ලැබේ.

## වෘත්තීය ඉංග්‍රීසි (Professional English)

වෘත්තීය විභාගයන්ට අයත් වන්නේ Business English Certificate විභාගයයි. මෙය අදියර 03කින් සමන්විත වේ.

1) BCC - Preliminary

2) BEC - Vantage

3) BEC - Higher

ඉහත පාඨමාලාවන් දෙකම විශ්ව විද්‍යාලයන්ට ඇතුළත් වීමේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සුදුසුකමක් ලෙස පිළිගනී. සාමාන්‍ය ඉංග්‍රීසි, වෘත්තීය ඉංග්‍රීසි යන 2කටම මෙම විභාගය වලංගු වේ. සාමාන්‍ය ඉංග්‍රීසි පාඨමාලාවේ CAE පාඨමාලාවත්, BEC විභාගයේ 3 අදියරත්, ICFE විභාගයත්, ICLE විභාගයත් එක මට්ටමේ පවතින විභාගයන් වේ. මෙම විභාග සඳහා ලංකාවේ පංති පැවැත්වෙන අතර ඊට සහභාගි වීමෙන් පසු විභාග වලට පෙනී සිටිය හැක. සහභාගී වන පංති සඳහා එම ආයතනයටත්, විභාග සඳහා Cambridge ආයතනයටත් ගෙවිය යුතු වේ. ලංකාවේ බලය ලත් විභාග මධ්‍යස්ථාන වන්නේ,

**British Council**
Alfred House Garden,
Colombo 03.
Tel: 0114521521

**CA Sri Lanka (Internal)**
No.30A,
Malalasekhara Road,
Colombo 07.
Tel: 0112352000

**Skills for life (Pvt) Ltd.**
"Skills Home",
Gothami Road,
Colombo 08.
www.skillsforlife.lk
Tel: 0112697766

**Royal Institute**
No.189, Havelock Road,
Colombo 05.
Tel: 0112556329

**ICBT**
No. 132/B,
Highlevel Road,
Nugegoda.
Tel: 0114334636

වැඩි විස්තර සඳහා CambridgeEnglish.org.

ඔබේ අනාගතය දෙස බලන්න. ඊට ගැළපෙන ලෙස ලබා ගත යුතු නිපුණත්වය අද තීරණය කරන්න. අද ඔබ වැය කරන මුදල අනාගත ආයෝජනයක් බවට පත් කරගන්න.



# CV, Bio data හදන්න පෙර හිතන්න....

**තිලාන් ජයතිලක**
**MBA in IT (University of Moratuwa)**
**BSC in Engineering (University of Peradeniya)**
**PGD in Management**
**CCVP, ACP, ITIL-V, CLA**

පාසලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ කාගෙත් බලාපොරොත්තුව වන්නේ හොඳ රැකියාවක් ලබා ගැනීමයි. හොඳ රැකියාවක් සඳහා අයදුම්පත්‍ර කොතරම් දැමුවත් රැකියාවක් නොලැබුණු බව අපේ තරුණ පරපුර නිරන්තරව නගන චෝදනාවක්. ඇත්තෙන්ම තරුණ තරුණියන් නගන චෝදනාවේ තිබෙන්නේම දෝෂයක්. මොකද රැකියා අයදුම් පත්‍රයක් යොමු කිරීමෙන්, රැකියාවක් නොව අපට ලබාගත හැක්කේ සම්මුඛ පරීක්ෂණය සඳහා අවස්ථාවක් පමණයි. සේවා යෝජකයා (Employer) රැකියාවට අයදුම් කරන පුද්ගලයාව පළමුවෙන්ම දකින්නේ (First Impression) රැකියා අයදුම්පත්‍රයෙනි. අයදුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද, කුසලතා පිළිබඳ කියවා බලා සේවායෝජකයා (Employer) සේවා දායකයා පිළිබඳ යම් ප්‍රතිරූපයක් ඇති කර ගනී. ඒ තුළින් යම් චිත්ත රූපයක් මවා ගනී. සේවා යෝජකයා මවා ගන්නා චිත්ත රූපය සුභවාදී වුවහොත් ඔබට සම්මුඛ පරීක්ෂණය සඳහා අවස්ථාවක් ලැබෙවී. නැතිනම් ඔබේ අයදුම්පත්‍රය කුණු ගොඩට යාවී. මේ නිසා ඔබ රැකියා අයදුම් පත්‍රයක් යොමු කරන විට ඔබගේ ප්‍රතිරූපය ඉහළම අයුරින් ප්‍රතිනිර්මාණය වන ලෙස අයදුම් පතක් යොමු කිරීමටත්, එමඟින් සම්මුඛ පරීක්ෂණයකට අවස්ථාවක් ලබා ගැනීමටත් සඳහා උත්සහ ගත යුතුයි.

රැකියා සඳහා අයදුම්පත් යොමු කිරීමේ දී ඒ සඳහා බොහෝ නම් සහ ආකෘති භාවිතා කරනු ලැබේ. "CV" "Resume" "Bio data" ඒ අතර ප්‍රධාන වේ. අයදුම්පත් ශෛලීන් ගත් විට බ්‍රිතාන්‍ය ශෛලීය, ඇමෙරිකානු ශෛලීය ලෙස ශෛලීන් දෙකකි. "CV" (Curriculum Vitae) යනු අයදුම්පත්‍ර සඳහා භාවිතා කරනු ලබන බ්‍රිතාන්‍ය නාමය වන අතර Resume යනු අයදුම්පත්‍ර සඳහා භාවිතා කරනු ලබන ඇමෙරිකානු නාමයයි. ඒ නිසා



CV "Resume" යනු රැකියා අයදුම්පත් සඳහා භාවිතා කරනු ලබන සමාන නාමයන් වේ. නමුත් CV" Bio data (ජීව දත්ත ආකෘතියක) අතර වෙනස්කම් තිබේ. නමුත් බොහෝ දෙනා CV සඳහා Bio data ආකෘතිය භාවිතා කරනු ලබන අවස්ථා සුලභව දක්නට ලැබේ. එය කිසිසේත්ම නොකළයුතු දෙයක්. මන්ද Bio data (ජීව දත්ත ආකෘතියක) අවධාරණය කරන්නේ පුද්ගලික තොරතුරු පිළිබඳවයි.

**<u>Bio data යනු ඔබ පිළිබඳ දිගු විස්තරයකි.</u>**

Bio data එකක් කෙටියෙන්, සංක්ෂිප්තව ලිවිය නොහැකියි. එහි තමා පිළිබඳ විස්තර දිගහැර ලිවිය යුතුයි. එය පොතක් හා සමානයි. උදාහරණ ලෙස Bio data යනු පොතක් නම් CV එකක් යනු පොතක පටුන වැනි දෙයක්. Bio data ඉදිරිපත් කළ යුත්තේ විදේශ විශ්ව විද්‍යාල, සඳහා අයදුම් කිරීම වැනි අවස්ථාවලදියි. එහිදි අයදුම්කරු ගෙන්වාගෙන බැලීමට නොහැකියි. එම නිසා සියළු විස්තර ඇතුළත් කර අයදුම්පත සැකසිය යුතුයි. ඔබේ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, ඔබ පිළිබඳව නිර්දේශිත ලිපි, ගිය පාසල, විශ්ව විද්‍යාලය, හැදෑරූ විෂයයන්, දක්ෂතා තමාගේ තිබෙන උස, ලේ වර්ගය ආදී සියල්ල දැක්විය යුතු අතර මෙය පිටු 7, 8 පමණ දක්වා දීර්ඝ විය හැකියි.

**<u>CV යනු තමාගේ ප්‍රතිරූපය වර්ධනය කරනු ලබන කෙටි විස්තරයකි.</u>**

CV සැකසීමේදී එය සීමිත කාලයක් තුළ කියවීමට හැකි වීමට තරම් ඉතා සංක්ෂිප්තව ඉදිරිපත් කල යුතුයි. CV එකක් Visiting card එකකට උපමා කල හැකියි. එසේත් නැතිනම් පෙර කියූ සේ Bio data යනු පත්තරයක් නම් CV යනු එහි පටුනයි. එනිසා පටුනක් තුළින් ඔබ කියන්නට යන්නේ කුමක් දැයි යන්න ඔබ තීරණය කළ යුතුයි. තමන් ළඟ තිබෙන සියළුම විස්තර CV එකට දැමීම තුළින් ඔබට සිදුවන්නේ

අවාසියක්. මන්ද සේවා යෝජකයාට අවශ්‍ය වන්නේ කෙටි කලක් තුළදී ඔබ රැකියාවට ගැලපෙන්නේ ද යන්න විමසා බැලීමටයි. එමනිසා CV එකට ඇතුළත් කළ යුත්තේ අදාල රැකියාව සඳහා ඔබ සතු වඩාත් ගැලපෙන සුදුසුකම්ය. ඔබේ අරමුණ විය යුත්තේ සේවා යෝජකයාගේ අවධානය ඔබ වෙත ලබා ගැනීම, ඔබ පිළිබඳ සුභවාදී ප්‍රතිරූපයක් ඇති කරලීමටයි. එම නිසා ඔබ සියලු දේ නොව රැකියාවට අදාල දෙයයි CV හි දැමිය යුත්තේ. CV තුළින් ඔබ විසින් ඔබව අලෙවි කළ (Market) යුතුයි. උදාහරණ ලෙස CV හි සුදුසුකම් දැමීමේදී ඔබ පාඨමාලාවක් හදාරමින් සිටිනවා නම් ඔබට එම පාඨමාලාව පිළිබඳවත් සඳහන් කළ හැකියි. පාඨමාලාව සම්පූර්ණ වීමට අවශ්‍ය වන්නේ නැත. පාඨමාලාව දැමීමෙන් කියවන පුද්ගලයා තුළ එය සම්පූර්ණයි කියන අදහස ඇති වේ. මෙය බොරු කීමක් නොව පුද්ගලිකව තමා විසින්ම තමාගේ තත්ත්වය පිළිබඳ ප්‍රකාශ කිරීමක් (Personal Branding). ඔබ පිළිබඳව සුභවාදී හැඟීමක් සේවා යෝජකයා තුළ ඇති කිරීමකි, සම්මුඛ පරීක්ෂණයේදී ඔබට ඒ පිළිබඳව සේවා යෝජකයාට අවබෝධ කල හැකි වේ.

## CV සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

### පෞද්ගලික විස්තර හා ජායාරූපය

ඔබ සකසන CV රැකියාවට අදාළව වෙනස්විය යුතු අතර රැකියාවට අදාළව සුදුසුකම් දැමිය යුතුයි. CV සකස් කිරීමේ දී නිශ්චිත ආකෘතියක් නොමැති නමුත් ඒ තුළින් ඔබගේ සුදුසුකම් දක්ෂතා පැහැදිලිව ඉස්මතු වන ලෙස සකස් කළ යුතුයි. ඔබ ඉදිරිපත් කරන්නේ අසම්පූර්ණ, අපැහැදිලි CV එකක් නම් ඒ තුළින් සංවිධානාත්මක බව, සැලසුම් සහගත බව වැනි සේවා යෝජකයා දැඩි ලෙස ඔබෙන් බලාපොරොත්තු වන කුසලතා නොමැති පුද්ගලයෙකු බව එමගින් සනාථ වේ. ඔබේ නම, දුරකථන අංක, ලිපිනය, විද්‍යුත් ලිපිනය ශීර්ෂ පාඨ ලෙස ඉහළින්ම සඳහන් කළ හැකිය. බොහෝ දෙනා CV සඳහා ජයාරූප දැමීම සුලභව සිදුවේ. නමුත් ජයාරූපයක් යෙදීමේදී ඒ පිළිබඳව ඔබ සැලකිලිමත් විය යුතු වේ. ප්‍රසන්න, සිත් ඇදගන්නා සුළු පෙනුමක් ඔබට තිබේ නම් ඔබේ ජායාරූපය CV තුළ අන්තර්ගත කළ හැකියි. නමුත් CV හි පින්තූරය දැමීමෙන් සේවා යෝජකයා තුළ ඔබ පිළිබඳ මැවෙන ප්‍රතිරූපය සුභවාදී නොවුනහොත් අවාසිය සිදුවන්නේ ඔබටයි එමනිසා ඔබේ සුදුසුකම් ඔබගේ වැඩ අත්දැකීම් තුළින් ඔබ පිළිබඳ පින්තූරයක් මවා ගත හැකි වන ලෙස තැබීමයි වඩාත් සුදුසු වන්නේ.

### වෘත්තීය අරමුණු (Objective)

බොහෝ විට තරුණ තරුණියන් අන්තර්ජාලයෙන් හෝ වෙන තැනකින් ගත් රැකියා අරමුණකුයි තමන්ගේ වෘත්තීය අරමුණ ලෙස සඳහන් කරන්නේ. මෙසේ වෘත්තීය අරමුණ දැමීමෙන් ඇතැම් විට ඔබ සිටින තත්ත්වයයි, යාමට බලාපොරොත්තු වන තත්ත්වයයි එතරම් නොගැලපෙන්නට පුළුවන්. කෙසේ වුවත් ඔබේ වෘත්තීය අරමුණ හා ඔබගේ වර්තමාන තත්ත්වය අතර ලොකු නොගැලපීමක් තිබුනොත් ඒ තුළින් අවාසියක් වන්නේ ඔබටයි. ඒ නිසා වෘත්තීය අරමුණ යෙදීමේදි තමාට වඩාත් ගැළපෙන යථාර්ථවාදී අරමුණක් යෙදීමයි වැදගත්. CV තුළින් අපේක්ෂා කරන්නේ තමාගේ ප්‍රතිරූපය ඉහළින්ම ප්‍රතිනිර්මාණය කිරීමයි (Personal Branding). ඒ නිසා අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් දැමීමේදී තමාගේ ප්‍රතිරූපය ඉහළ මට්ටමින් පෙනෙන පරිදි කුතුහලයක් ඇතිවන පරිදි දැමිය යුතුයි. ඉදිරිපත් කරන කරුණු පැහැදිලි විය යුතුයි. ලොකු විස්තර හැලි මෙහි නොලීවීමට මතක තබාගත යුතුයි. විස්තර දැමිය යුත්තේ කරුණෙන් කරුණයි.

### CV හි සුදුසුකම් ඇතුලත් කිරීම.

කාලානුරූප ක්‍රමය අනුව (Chronological). අතීතයේ සිට වර්තමානය දක්වා යන ආකෘතියට අනුව ඔබ තොරතුරු ඇතුළත් කළහොත් සේවායෝජකයා මුලින්ම දකින්නේ ඔබ පිළිබඳ පරණ තොරතුරු නම් එහි වැදගත්කම අඩු වේ. ඔබ අවධාරණය කළ යුත්තේ ඔබේ සුදුසුකම් පළපුරුද්ද පිළිබඳ අලුත්ම, මෑත කාලයේ තොරතුරුයි.

වෘත්තීය පළපුරුද්දක් නැති පුද්ගලයෙකුට තමන්ගේ පළපුරුද්ද දැක්වීමට (Personal experience) ආධුනිකයෙක් ලෙස ලබාගත් පළපුරුද්ද (Internship experience) දැමිය හැකියි. ආධුනිකයෙක් ලෙස ලබාගත් පළපුරුද්ද නොමැතිව පළමුව රැකියාවකට යනවා නම්, ඔබ පාසල් කාලයේ විශ්ව විද්‍යාල කාලයේ කළ ව්‍යාපෘති ආදියත්, සමිති සමාගම්හි කළ කාර්යයනුත්, ස්වේච්ඡා කටයුතු ඔබගේ පළපුරුද්ද යටතට දැමිය හැකියි. නමුත් පාසල් කාලයේ විශ්ව විද්‍යාල කාලයේ කළ ව්‍යාපෘති ආදිය දැමීමේ දී යම් කිසි අධීක්ෂණයක් යටතේ සිදු කල එකක් විය යුතුයි. උදාහරණයක් ලෙස විශ්ව විද්‍යාලයේ අවසන් වසරේ වන ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති මේ යටතේ සඳහන් කළ හැකියි. සුදුසුකම් ඇතළත් කිරීමේදී අවශ්‍ය නම් ඔබට වෘත්තීය විභාගයන්හි සංකේත, වැනි දේවලුත් යෙදිය හැකියි. උදාහරණයක් ලෙස වෘත්තීය විභාගයන්හි එක් එක් අදියරයන් නිරූපණය වන සංකේත තිබේ. ඒවා දැමීමෙන් අදාල වෘත්තීය සුදුසුකම අනුව අයදුම්කරු සිටින මට්ටම සේවා යෝජකයාට තේරුම්ගත හැකියි.

අද තරුණ තරුණියන් බෙහෝ දෙනෙක් සමාජ ජාල වෙබ් අඩවි භාවිතා කරන අතර වෘත්තීයවේදීන් ගෙන් සමන්විත සමාජ ජාල වෙබ් අඩවි තිබේ. උදාහරණයක් ලෙස LinkedIn සඳහන් කළ හැකියි. 80% පමණ රැකියා අවස්ථා එන්නේ මෙම වෙබ් අඩවි ඇසුරෙනි. එහිදී වෘත්තීයවේදීන්ගෙන් සමන්විත එවැනි සමාජ ජාල වෙබ් අඩවියක

තමන්ගේ ප්‍රතිරූපය ඉහළ නැංවෙන පරිදි තමන්ගේ සුදුසුකම්, ලබාගත් ජයග්‍රහණ, තමා පිළිබඳව අන් අය ලබාදුන් නිර්දේශයන් ආදී සියල්ල ඇතුළත් කළ හැකියි. මෙහි සම්බන්ධතාවයන් (Link) ඔබගේ CV එකටත් දැමිය හැකියි. ඒ තුළින් ඔබේ සේවායෝජකයාට අවශ්‍ය වැඩි විස්තර එමඟින් ලබා ගත හැකියි.

## <u>නිර්දේශකයින් (Referees)</u>

නිර්දේශකයින් (Referees) පිළිබඳ ඉල්ලා ඇත්නම් ඒ පිළිබඳ සඳහන් කළ හැකියි. එහිදී අවශ්‍ය වන්නේ නම් නිර්දේශකයින් ලබා දිය හැකියි. (Referees will be provided upon request) යනුවෙන් දැමිය හැකියි. Referees යොදනවා නම් ඒ පිළිබඳ නිර්දේශකයින් (Referees) දැනුවත් කළ යුතුයි.

## <u>ආවර්ණ ලිපිය (Covering letter)</u>

වර්තමානයේ CV යවනු ලබන්නේ අන්තර්ජාලය හරහායි. එවිට ලිපිය ලිවීමට නියමිත කොටස (Mail Body) ඔබට ආවර්ණ ලිපිය ලෙස භාවිතා කළ හැකියි. ලිපිය ලිවීමට නියමිත කොටස Mail body පේළි 2,3 කින් රැකියාවට ඇති තමන්ගේ යෝග්‍යතාවය ඉහළ මට්ටමින් නිරූපනය වන පරිදි සැකසිය යුතු වේ.

CV සකස් කළ පසු එය හොඳ දැනුමැති පුද්ගලයෙකු ලවා පරීක්ෂා කර ගැනීම ඉතා වැදගත්. Google සමාගමේ කළමනාකරු ප්‍රකාශ කරන්නේ ඔබ තොරතුරු තාක්ෂණ කළමනාකරුවෙකු වීමට අයදුම් කරන්නේ නම් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රධානියෙකු (IT Head) ලවා එය පරීක්ෂා කරගත යුතු බවයි. අනිත් කරුණ නම් අපි අපේක්ෂා කරන තනතුරට ලඟා වු පුද්ගලයෙකු ලවා පරීක්ෂා කර ගැනීම තුළින් CV අඩුපාඩුකම් මොනවාද කියා දැනගත හැකියි. ප්‍රධානියා අප අපේක්ෂා කරන තැනට ලඟා වූ කෙනෙක් බැවින් ඔහුට ඔබගේ CV එකේ අඩුපාඩු පහසුවෙන් හඳුනා ගත හැකියි. රැකියා සඳහා අයදුම්පත් දැමීමේ දී, නව ප්‍රවණතාවයන් සැලකිල්ලට ගනිමින් තමාව ඉතා හොඳින් නිරූපණය වන පරිදි අවබෝධයකින් යුතුව අයදුම්පත දැමීම මගින් සේවාලාභියාගේ අවධානය දිනාගැනීමටත්, එමඟින් සම්මුඛ පරීක්ෂණය සඳහා අවස්ථාවක් ලබා ගැනීමටත් ඉහත සඳහන් කළ කරුණු ඔබට වැදගත් වනු ඇත.

### ආදර්ශ අයදුම්පත්‍රය

# Thilan Ekanayake

## Manager ICT

**AREAS OF EXPERTISE**

*Project management*
*IT management*
*Managing crisis situations*
*Resource vendor management*
*Business analysis*
*Project Delivery*
*Integration*
*Linux Administration*
*Designing Networking solutions*

**PROFESSIONAL**

*Novel Certified Linux Administrator (**CLA**)*
*Certified Lead Implementer Professional for ISO 27001(**CLIP**)*
*Acme Packet Network Professional (**ANP-N**)*

**PERSONAL SKILLS**

*Decision making*
*People skills*
*Leadership skills*
*Team work*

**RESEARCH INTEREST AREAS & PUBLICATIONS**

*Green IT Motivation, Analysis of factors motivating organizations to implement Green IT (http://www.scirj.org/research-journal-0813/paper-02.php)*

**INTERESTS**

Composing music, Travelling, Photography

**PERSONAL DETAILS**

***Thilan Jayathilake***
*(00) 94 77 3876041*
*thilandeneth@gmail.com*
***Thilan Jayathilake-Linkdn***
***Profile***

**OBJECTIVE**

To build a career in the field of ICT infrastructure specializing in the field of computer networks, practice etc. Looking for a challenging and growing opportunity to make my contribution in above areas.

**WORK EXPERIENCE**

**V S Information Systems**
**Senior Network Systems Engineer**
**(September 2015 – Up to date)**

- Overall responsibility on completing network infrastructure and security projects.
- Analyze business requirements to develop technical network solutions for customers.
- Perform network modeling, analysis, planning and develop technology roadmaps.

**IgnitionOne Inc. (CMS)**
**Senior Network Engineer**
**(July 2014 – August 2015)**

- Managing and maintaining all the network equipment (Cisco 6500, A10, A5 load balancers, ASA firewalls, HP Blade servers etc)
- Managing and monitoring the performance of the Network Management Solution (Solarwinds, Collectd, Zabbix) and report/performance issues to the Line Manager.
- VM Ware server administration.

**ACADEMIC QUALIFICATIONS**

**BSc. Computer Systems and Networking –** Curtin University of Technology Western Australia

**MBA-IT** at University of Colombo Sri Lanka (Research: Green IT)

**REFERENCES**

**NISHAN JAYATHILAKE**
Manager – Networks and Communications
Commercial Bank of Ceylon PLC
Mobile : +94773876947
Email : nishanjayathilake@combank.net

**NIMESH BANDARA**
Head of IT and Complience, WNS Sri Laka
Phone : +94 11 269 5022 Fax : +94 11 876 7346
Mobile : +94783037749
Email : Iresh.Bandara@wnsgs.com

**එක පිටුවකට වන සේ සාරාංශ කොට සකස් කර ඇත.**

# ජාතියට අභිමානයක් ගෙනදෙමින් ඉදිවන NSBM හරිත සරසවි නගරය



ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යාතනය හෙවත් NSBM ආයතනය, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය හෙවත් NIBM ආයතනයේ උපාධි ලබාදෙන ආයතනයයි. පුරා වසර 47ක ඉතිහාසයක් ඇති NIBM ආයතනය මෑතකදී ඉතා සීඝ්‍ර දියුණුවකට ලක්වීය. ඒ අනුව නවීන ශාඛා ජාලයකින් හා වාර්තාගත සිසුන් සංඛ්‍යාවකින් පිරි ආයතනයක් බවට පත් වූ NIBM ආයතනය 2011 වර්ෂයේදී තවත් ඉදිරි පියවරක් තබමින් NSBM ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ජාතන්තර මට්ටමේ පහසුකම් වලින් සපිරි, සැබෑ විශ්වවිද්‍යාල ජීවිතයක් ලබා දීමට අවැසි පරිසරයක් සහිත දැවැන්ත විශ්වවිද්‍යාලයක් ඉදිකිරීම එම ව්‍යාපෘතියේ අරමුණ විය. ඒ අනුව 2013 වර්ෂයේ වර්ග මීටර් 80, 000කට වැඩි ඉදිකිරීම් වලින් සමන්විත NSBM හරිත සරසවි නගරයේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

NSBM හරිත සරසවිය කළමනාකරණ, පරිගණක හා ඉංජිනේරු යන පීඨයන්ගෙන් සමන්විත වන අතර එහි එකවර අධ්‍යාපනය ලැබිය හැකි සිසු ධාරිතාව 30, 000කි. අක්කර 26ක ඉතා මනරම් භූමි ප්‍රදේශයක ඉදිවෙන NSBM හරිත සරසවිය සම්ප්‍රදායික විශ්වවිද්‍යාල රටාවෙන් බැහැරට ගොස් විශ්වවිද්‍යාල නගර සංකල්පය අප රටට හඳුන්වා දෙයි. ඒ අනුව මෙම සරසවිය තුළ විශ්වවිද්‍යාල ප්‍රජාවකට ජීවත්විය හැකි පරිදි නිවාස පහසුකම්, වෙළෙඳ සංකීර්ණ නවතම දේශනාගාර, පරිගණක විද්‍යාගාර පොත් මිලියනකින් සමන්විත දැවැන්ත පුස්තකාලයකින් ආදි පහසුකම් රැසකින් සමන්විත වේ. එසේම විශ්වවිද්‍යාල සිසුන්ගේ කලා කටයුතු වැඩි දියුණු කිරීමට උපකාරී වන ශ්‍රවණාගාරයක්, එළිමහන් රංග පීඨයක් හා ශිෂ්‍ය මධ්‍යස්ථානයක් මෙම සරසවිය තුළ ඉදිවේ. න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුමෙන් පිරිපුන් උපාධිධාරීන් බිහිකිරීමේ අරමුණෙන් කළමනාකරණ මූලධර්ම ප්‍රායෝගිකව අත්හදා බැලීම සඳහා විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළම කුඩා කර්මාන්ත ශාලාවක් හා කොටස් වෙළඳපොළට පිවිසිය හැකි කුඩා කාර්යාලයක් NSBM තුළ ඉදිවේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත ලෝකයේ ඉහළ ශ්‍රේණිගත කිරීම් වලට ලක්ව ඇති විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධව ක්ෂේත්‍රයට ගැළපෙන සාම්ප්‍රදායික රටාවෙන් බැහැරව හඳුන්වාගෙන නව උපාධි පාඨමාලා 60කට වැඩි ප්‍රමාණයක් NSBM තුළින් පිරිනැමුණු ඇත. මෙම පාඨමාලා සඳහා දේශීය සිසුන් මෙන්ම විදේශීය සිසුන් 1000ක් පමණ ද බඳවා ගැනීම මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණකි. NSBM සරසවි නගරය ඉදිකිරීමත් සමඟ ශ්‍රී ලංකාවට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ රැසකි.

- අ. පො. ස. උසස් පෙළ නිම කොට ජාතික විශ්වවිද්‍යාල සඳහා අවස්ථාව නොලැබෙන සිසුන්ට උසස් අධ්‍යාපනයට අවස්ථාව ලබාදෙමින් රටේ මානව සම්පත් සංවර්ධනයට දායක වීම.
- විදේශ රටවල උසස් අධ්‍යාපන කටයුතු සඳහා යොමු වන පිරිස අපේ රට තුළම රඳවා ගැනීමෙන් විදේශ විනිමය ඉතිරි කිරීම.
- විදේශ සිසුන් ශ්‍රී ලංකාවට ආකර්ශනය කර ගැනීම මඟින් රටට විදේශ විනිමය ගලා ඒමට දායක වීම.

## NSBM නාගරික ශාඛාව

NSBM හරිත සරසවියේ කටයුතු නිම වනතුරු ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යාතනයේ කටයුතු ක්‍රියාත්මක වන්නේ නුගේගොඩ අනුලා විද්‍යාලය අසල ස්ථාපිත NSBM නාගරික ශාඛාව මගිනි. මෙම ශාඛාව තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ අනුමත පාඨමාලා මෙන්ම අයර්ලන්තයේ ඩබ්ලින් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානියේ ප්ලිමත් විශ්වවිද්‍යාලය හා මැලේසියාගේ ලිම්කොක්වින් සරසවිය හා ඒකාබද්ධව පිරිනමන පරිගණක, කළමනාකරණ, අභ්‍යන්තර සැලසුම්කරණය, බහුමාධ්‍ය, ව්‍යාපාර සන්නිවේදනය ආදී ඉතා වැඩි ඉල්ලුමක් ඇති පාඨමාලා පිරිනමනු ලැබේ. දැනට NSBM නාගරික ශාඛාව තුළ සිසුන් 5400 ක් පමණ අධ්‍යයන කටයුතු වල නිරත වේ. මුල් අවුරුදු දෙක පූර්ණ කාලීන ලෙසත් අවසාන අවුරුදු දෙක අර්ධ කාලීන ලෙසත් ක්‍රියත්මක වන බැවින් උපාධිය ලබාගන්නා අවස්ථාව වන විට සිසුන්ට අවුරුදු දෙකක පළපුරුද්දක් තිබීම NSBM පාඨමාලා වල ඇති විශේෂත්වයකි.

## NSBM පාඨමාලා

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ අනුමත පාඨමාලා**

<u>කළමනාකරණ</u>
BSC in Business Management (Special)

**<u>Specialised in</u>**

Human Resource Management (HRM)
Industrial Management
Logistics Management
Project Management
**B.A. in Business Communication**

<u>පරිගණක</u>

BSC in Management Information Systems (Special) (MIS)
BSC in Software Engineering (Special)
BSC in Multimedia

<u>එක්සත් රාජධානියේ ප්ලිමත් විශ්වවිද්‍යාලය මඟින් පිරිනමන පාඨමාලා</u>

BSC (HONS) International Management
BSC (HONS) Marketing Management
BSC (HONS) Accounting & Finance
BSC (HONS) Operations & Logistic Management



BSC (HONS) Events, Tourism & Hospitality Management
BSC (HONS) Business Communication
BSC (HONS) Software Engineering
BSC (HONS) Computer Network
BSC (HONS) Computer Security

<u>මැලේසියාවේ ලිම්කොක්වින් සරසවිය මඟින් පිරිනමන පාඨමාලා</u>

BA  Interior Design
BA (HONS) in Creative Multimedia

ලිපිනය,
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යාතනය,
නො. 309,
හයිලෙවල් පාර,
කොළඹ 05.
දුරකථන : 011 5445000
www.nsbm.lk

සාකච්ඡා කොට සකස් කළේ,

තමරා ප්‍රියන්ති
මානව සම්පත් සංවර්ධන නිලධාරි
චන්ද්‍රිකා.පී.වීරරත්න
මානව සම්පත් සංවර්ධන නිලධාරි

# අන්තර්ජාල මුදල් ඉපැයීම් ක්ෂේත්‍රයේ වර්තමාන ප්‍රවණතාව

## දැනුම හා ව්‍යාපාර ක්‍රියා බාහිරකරණය
## KPO & BPO






සනත් මල්ලව ආරච්චි
මානව සම්පත් සංවර්ධන නිළධාරි

ව්‍යාපාර ක්‍රියා බාහිරකරණය BPO (Business Process Outsoaring) වර්තමාන ලෝකයේ ව්‍යාපාරික ගැටලු සඳහා විසඳුම් සපයනු ලබන එක් සාර්ථක ක්‍රමයකි. එසේම දේශීය ආදායම ඉහළ නංවා ගැනීම කෙරෙහි ඉහළ බලාපොරොත්තු තබා ඇති ක්ෂේත්‍රයකි. ආසියාතික කලාපයේ මේ පිළිබඳ ඉහළම අත්දැකීම් ලබා ඇති රට වන්නේ ඉන්දියාවයි.

BPO හි මූලික පරමාර්ථය වන්නේ ව්‍යාපාරික කටයුතු, පරිපාලනය හෝ මෙහෙයුම් කරණය තෙවන පාර්ශවයක් හා බෙදා ගැනීමයි. හැකි නම් ව්‍යාපාරික ක්‍රියාකාරකම් වෙනත් ආයතනයක් මඟින් සිදු කරවා ගැනීමයි. විශේෂයෙන් මූල්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, පාරිභෝගික සේවා, වැටුප් වාර්තා සැකසීම ආදී ක්‍රියාකාරකම් තෙවන පාර්ශවයක් මඟින් සිදු කර ගැනීම මේ යටතේ බහුලව සිදුවේ.

මෙමඟින් විශ්වාසනීයව, කාර්යක්ෂමව කලට වෙලාවට කටයුතු කිරීමට හැකියාව ලැබෙන නිසා ආයතනයන්ට ඉහළ සාර්ථකත්වයක් අත්කර ගැනීමට හැකි වේ. ව්‍යාපාර ක්‍රියා බාහිරකරණය ආශ්‍රිතව බාහිරකරණ ආයතනයකට (BPO) සම්බන්ධ වීමෙන් හෝ ස්වාධීන රැකියාවක් (Freelance Job) වශයෙන් ද BPO ක්ෂේත්‍රයේ රැකියාවක නිරත වීමේ අවස්ථාව පවතී. BPO ක්ෂේත්‍රයේ කටයුතු කිරීම සඳහා සාමාන්‍ය ඉංග්‍රීසි හා පරිගණක සාක්ෂරතාවක් ප්‍රමාණවත් වේ. එමනිසා පාසල් අධ්‍යාපනයෙන් පසුව ඔබගේ පවතින දැනුම මත මෙම අංශයේ රැකියා සඳහා ප්‍රවේශ වීමට හැකි වේ.

වර්තමානය වන විට BPO ක්ෂේත්‍රයද නව ප්‍රවණතා ඔස්සේ වර්ධනය වෙමින් පවතී. අන්තර්ජාල මුදල් ඉපයීම් ක්ෂේත්‍රයේ වර්තමාන ප්‍රවණතාව වන්නේ දැනුම බාහිරකරණයයි. එනම් Knowledge Process Out Source (KPO) ලෙස ව්‍යවහර කරනු ලබයි. සාමාන්‍ය කටයුතුවලට වඩා වැදගත්කමක් ඇති වෘත්තීය නිපුණත්වය භාවිතා කරමින් ඉහළ ව්‍යාපාරික සේවා බාහිරකරණ කටයුතු කිරීම මෙමඟින් සිදු වේ. මේ සඳහා BPO වලට වඩා ඉහළ අධ්‍යාපන පසුබිමක් අවශ්‍ය වන අතර විශේෂයෙන් වෘත්තීයවේදීන්, වෘත්තීමය සුදුසුකම්ලත් උසස් අධ්‍යාපන පසුබිමක් සහිත වූවන් මෙම ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය වන අතර එවැනි වෘත්තිකයින්ට මෙමඟින් ඉහළ ආදායමක් උපයා ගත හැකිය. KPO ක්ෂේත්‍රය තුළ සෑම ආකාරයකම පර්යේෂණ කටයුතු හා තොරතුරු සම්පාදන ක්‍රියාවලින් ව්‍යාපාරික හා වෙළඳපොළ පර්යේෂණ, නීතිමය කටයුතු, වෛද්‍යමය හා ඉංජිනේරුමය සේවාවන්, පුහුණු, උපදේශන, පර්යේෂණ හා සංවර්ධන, ෆාමසි හා ජීව තාක්ෂණවේදය කටයුතු පිළිබඳ අධ්‍යයන, පරිගණක මෘදුකාංග හා

නිර්මාණ වැනි ක්ෂේත්‍රයන් KPO ක්ෂේත්‍රය තුළ සේවය ලබා දිය හැකි ප්‍රධාන ක්ෂේත්‍රයන් ලෙස හඳුන්වා දිය හැකිය. මෙම ක්ෂේත්‍රයන් ආශ්‍රිතව සේවය ලබාදීම උදෙසා වෘත්තීමය නිපුණතාවයක් අවශ්‍ය වන බව ඔබට දැන් පැහැදිලි වනු ඇත. වෙළඳපල යාන්ත්‍රණය කඩිනම් වීම හා ඊට සමගාමීව සේවා දායකයින් කඩිනම් වීම හා ඉහළ ගුණත්වයක් බලාපොරොත්තු වීම මත ව්‍යාපාර ආයතන නව ක්‍රමවේද සොයා යාමට පෙළඹීම මත ප්‍රවීණතාවය හා නිෂ්පාදනය, ගුණත්වය හා ලාභය වැඩිකර ගැනීම යන අරමුණු ඉටු කර ගැනිම සඳහා KPO වෙත ව්‍යාපාරික ලෝකය යොමු වී ඇත. වර්තමාන ව්‍යාපාර ලෝකය KPO වෙත යොමු වීමේදී මුහුණ දෙන වාසි හා අවාසි සහගත තත්ත්වයන් කිහිපයක් හඳුනා ගැනීමට පුළුවන් වේ.

**වාසි**

- අඩු වියදම් ක්‍රමවේදයක් වීම.
- කුසලතා සහිත සේවකයන් බඳවා ගැනීමට හැකිවීම.
- විවිධ ක්ෂේත්‍ර වල වෘත්තීයවේදීන් අඩු වියදමට බඳවා ගත හැකි වීම.
- උගතුන්ගේ රැකියා වියුක්තියට විසඳුමක් වීම.
- ආයතන වල මානව සම්පත් හා කාල කළමනාකරණ ගැටලු වලදී නම්‍යශීලී වීම.

**අවාසි**

- සමාගම් සතු තොරතුරු බැහැර වීමේ ආරක්ෂක අවාසිය.
- සේවකයාගේ චරිතය වැඩවල ගුණාත්මකභාවය පිළිබඳ සහතික වීමට නොහැකි වීම.
- මුලික නිපුණතාවන් රඳවා තබා ගැනීම පිළිබඳ ගැටලුව
- KPO ක්‍රමවේදය හරහා ගැටලු විසඳා ගැනීමේදී කිසියම් කාලයක් ගත වීම.
- සමාගම් හා හවුල්කරුවන් අතර සන්නිවේදනය, නීතීමය, භාෂාමය, සංස්කෘතිමය බාධා පැවතීම.

උක්ත සාධක KPO ක්ෂේත්‍රයේ වාසි හා අවාසි සහිත නැත්නම් අවධානම් සහිත කරුණු වශයෙන් හඳුනා ගැනිමට පුළුවන් වේ. කෙසේ වෙතත් වර්තමාන ලෝකයේ බොහෝ රටවල් මුහුණපාන ගැටලුවක් වන උගතුන් අතර සේවා වියුක්තියට KPO මඟින් ලබා දෙන්නේ සාධනීය පිළිතුරකි.

BPO හා සලකා බැලීමේදී KPO හි විශේෂතා රැසක් පවතී. එනම් ආයතන KPO සඳහා අපේක්ෂා කරන්නේ උගතුන් වෘත්තීයවේදීන් හා කුසලතා පූර්ණ සේවකයන් වේ. මෙම සේවාවන් මඟින් ඔවුනට ඉතාම ඉහළ ආදායම් ඉපැයිය හැකිවේ. KPO මඟින් ආයතනයක ඉතාම වැදගත්ම කාර්ය-භාර්යන් ඉටු කරනු ලබයි. සේවාදායකයින් වෙනුවෙන් ඉතා වැදගත් කාර්ය භාර්යන් ඉටු කිරීම KPO මඟින් අපේක්ෂා කෙරේ.

KPO ක්ෂේත්‍රයේ නියලී සිටින ආසියාවේ ප්‍රධානතම රට වන ඉන්දියාව දෙස බැලීමේදී ඉන්දියාවේ විශාල පිරිසක් පශ්චාත් උපාධිධාරීන් (PhD, MBA) KPO ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්තව සිටියි. ඔවුහු සිය හැකියාවන් තුළින් රටට විශාල විදේශ විනිමයක් උපයා දෙති. ඉන්දියාවේ මෘදුකාංග හා සේවා ආයතන පිළිබඳ ජාතික සංවිධානය (NASSCOM) සඳහන් කරන පරිදි 2005 එරට මුළු KPO ආදායම ඩොලර් බිලියන 1.3 කි. එය 2006 දී ඩොලර් බිලියන 1.5 කි. 2010 දී උපකල්පනය කර තිබුණේ 2015 වන විට මුළු KPO වෙළඳපලෙන් 15% ක්





ඉන්දියාව තුළ සිදු කිරීමටයි. ඉන්දියාවේ මුළු අපනයන ආදායමෙන් ඩොලර් බිලියන 8.4 ක් ITBPO හා KPO ක්ෂේත්‍රයන්ගෙන් ආවරණය වී ඇත. 2015 දී ලෝක ව්‍යාප්ත මුළු KPO වටිනාකම ඩොලර් බිලියන 17 ක් අපේක්ෂා කර තිබූ අතර ඉන් ඩොලර් බිලියන 12 ක් ඉන්දියාව මඟින් සිදු කරවා ගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් 2015 වනවිට ඉන්දියාවේ 250,000කට අධික ප්‍රමාණයක් KPO ක්ෂේත්‍රයේ නිරතව සිටියි.

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා අනුව ITBPO හා KPO යන ක්ෂේත්‍රයන් ශ්‍රී ලංකාවේ 05 වන අපනයන ආදායම උපයන ක්ෂේත්‍රය බවට පත් වී ඇත. 2012 වාර්තාවට අනුව ITBPO අංශය තුළින් ඇමරිකානු ඩොලර් මිලියන 400 ක් උපයාදී ඇත. 2011 Global Services Magazine හි AT Kearny දක්වා ඇත්තේ මෙම කර්මාන්තයේ යා යුතු රටවල් අතර ලෝකයේ පළමු රටවල් 2, 3 අතරට ශ්‍රී ලංකාව ඇතුළත් වන බවත්, පළමු නගර 10ට කොළඹ නගරය ඇතුළත් වන බවත්ය.

ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තියේ ස්වභාවය තුළ ඉහළ අධ්‍යාපනයක් ලබාගත් පිරිස තුළ ඉහළ විරැකියා අනුපාතයක් පැවතීම මෙන්ම ඉහළ අධ්‍යාපනයක් ලැබූ වෘත්තිකයින් සිය වැටුප් පිළිබඳ තෘප්තිමත් නොවන පසුබිමක් තුළ KPO වෙත යොමු වීම උසස් අධ්‍යාපනය ලබන්නන්ට මෙන්ම වෘත්තීයවේදීන්ට කිසියම් උත්තේජනයක් සපයනු ඇත.

විශේෂයෙන් උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් වීමට සාපේක්ෂව ආර්ථිකයේ රැකියා අවස්ථා බිහි නොවීම නිසා ඇතිවන ඉච්ඡා භංගත්වයට මෙන්ම බුද්ධි ගලනයට කිසියම් සාධනීය පිළිතුරක් KPO ප්‍රචලිත කිරීම තුළින් ලබාගත හැකිවනු ඇත. දැනට ලංකාවේ ITBPO හා KPO සඳහා යොමුවීමට මඟ පෙන්වන ආයතන රැසක් බිහිවී පවතින අතර අන්තර්ජාලය ඔස්සේද මෙම ආයතන හා සම්බන්ධ වී කටයුතු කිරීමේ අවස්ථාව පවතී. ලංකා BPO ඇකඩමිය මේ සම්බන්ධයෙන් 2010 වසරේ සිට මඟ පෙන්වනු ලබන ආයතනයක් වශයෙන් සඳහන් කිරීමට හැකිය. මෙම ක්ෂේත්‍රයේ ස්වාධීන රැකියාවන්හි (Freelance) නියුතුවන්නන් බහුලව භාවිතා කරන වෙබ් අඩවි කිහිපයක් වශයෙන් www.upwork.com" www.elance.com" www.freelancer.com වැනි වෙබ් අඩවි භාවිතා කරනු දැකගත හැකිය. ඉදිරියේ දින් IT BPO හා KPO ක්ෂේත්‍රයන් නව මානයන් ඔස්සේ දියුණුවනු ඇත. මෙම ක්ෂේත්‍රයන්ට යොමු වී සේවය ලබා දීම සඳහාත්, ඉහළ ආදායමක් උත්පාදනය කිරීම සඳහා ඔබට වඩාත් ගැළපෙන ක්ෂේත්‍රය තෝරා ගෙන එහි වෘත්තිකභාවය ලබා ගත යුතුය. නිපුණත්වය ලබා ගත යුතුය. ඒ තුළින් ජාතික දේශ සීමා පරයායමින් ඔබගේ වෘත්තිකභාවය තුළින් සේවය ලබා දීමටත්, ඉහළ ආදායමක් උපයා ගැනීමට ඔබට හැකි වනු ඇත.

# සමාජ සේවය, ස්වේච්ඡා සේවය තුළින් ජාත්‍යන්තර සංවිධානයක වෘත්තියකට



**මල්මි වීරසිරි**
Financial Management Professional
United National Development
Program

මිනිසුන් ලෙස අපි බොහෝ පිරිසක් කැමති වන්නේ තමන්ට වඩාත් පහසු කාර්යයන් කරමින් සුවපහසු ලෙස ජීවත් වීමටයි. මේ සුවපහසු කලාපය තුළ සුව පහසු කාර්යයන් කරමින් සිටීමට හැකි වුවත්, ඔබේ ලොකු ප්‍රගතියක් ඒ තුළින් ලබාගත නොහැකියි. සරල කාර්යයන් කිහිපයකට සීමා වෙමින් ඔබට ඒ තුළ සිටිය හැකියි (Comfort Zone). නමුත් ඔබට දියුණුවීමට අවශ්‍ය නම් ඔබ සුවපහසු කලාපයෙන් එපිටටවිත් තිබෙන අවස්ථාවන් පිළිබඳ විමසා බැලිය යුතුයි. සොයා ගත යුතුයි. සුවපහසු කලාපයෙන් එපිටට ඇවිත් නව අවස්ථාවන් සොයා ගිය පුද්ගලයින් තුළිනුයි මේ ලෝකය වෙනස් වුයේ.

සුවපහසු කලාපය තුළ නොසිට ලෝකය පුරා ගමන් කරමින්, මුළු ලෝකයටම විවෘත වෙමින් කළ හැකි රැකියා අවස්ථාවන් ඕනෑතරම් තිබේ. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක වැඩ කිරීම එවන් රැකියාවක්. එලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ සිය වෘත්තීය භූමිකාව කරමින්, ලෝකයේ බොහෝ රටවල් ප්‍රමාණයකට සේවාව ලබා දීමට ස්ත්‍රී පුරුෂ භාවය වැනි සීමාවන් අදාල වන්නේ නැත. මෙවර අප ඔබට හඳුන්වා දෙන්නේ ජාතික දේශ සීමා අභිබවා යමින් ලෝකයටම සේවාවන් ලබා දෙන කාන්තා චරිතයක් පිළිබඳවයි. ඇය නමින් මල්මී වීරසිරි. ඇගේ වෘත්තීය භූමිකාව, සීමා මායිම් බිඳ හැර වෘත්තීයකට ප්‍රවේශ වීමට අපේක්ෂා කරන ඔබට ආදර්ශයක් වනු ඇත.

**එක්සත් ජාතින්ගේ සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධායකට ප්‍රවේශවීමට අවශ්‍ය පසුබිම සකස් වූයේ කෙසේද?**

එක්සත් ජාතින්ගේ සංවිධානයේ (UNO) හි මූල්‍යකරණය ආශ්‍රිත රැකියාවකට සම්බන්ධ වීම එකවර ගත් තීරණයක් නොවේ. මම හිතන්නේ මගේ මේ වෘත්තීය භූමිකාවට අවශ්‍ය පසුබිම සකස් වූයේ මාගේ පාසල් කාලය හා ඉන්පසු මාගේ ජී විතයේ තෝරා ගැනීම් නිසයි. මම මූලික අධ්‍යාපනය ලැබුවේ පානදුර සුමංගල විද්‍යාලයෙන්. මගේ මවට අවශ්‍ය වුණේ මට උගන්වලා ඉහළම තැනකට ගැනීමටයි. ශිෂ්‍යත්ව විභාගය සමත් වු මාව ඇය කොළඹ විශාඛා විද්‍යාලයට ඇතුළත් කළේ එවන් බලාපොරොත්තුවකිනි. විශාඛා විද්‍යාලයේ සිටින කාලය ඉගෙනීම, ක්‍රීඩාව, යහළුවන් සමඟ එකතු වී අන් අයට උදව් කිරීම ආදී දේ වලිනුයි පිරී තිබෙන්නේ. සමාජ සේවා වැඩකටයුතු බොහෝමයක් කළා. ඒ කාලයේ හොඳින් හිතා බලා ජීවිතයේ තීරණ ගත්තා. උසස් පෙළ කළේ විද්‍යා විෂය ධාරාවෙන්. විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණේ ගෘහ නිර්මාණ ශිල්පී පාඨමාලාව හැදෑරීම සඳහා. ගෘහ නිර්මාණ ශිල්පයට මගේ එතරම් කැමැත්තක් තිබුණේ නැහැ. එනිසායි මම CIMA කළේ. ඒ කාලයේ මගේ අදහස වුනේ CIMA කරලා ඒ තුළින් ඉදිරියට යා යුතුයි කියන අදහස හා මිනිසුන් වෙනුවෙන් සේවය කළ යුතුයි කියන අදහස. මොකද කුඩා කාලයේ සිට මම තෘප්තියක් ලැබුවේ මිනිසුන් සමඟ, සමාජය සමඟ කරන කටයුතු ඒ තුළින්. අද මම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කරන රැකියාව මිනිසුන් සමඟ වැඩ කිරීමට මගේ ඇති කැමැත්ත හා කළමනාකරණ ගණකාධිකරණ යන ක්ෂේත්‍ර දෙකේම සංකලනයක්.

**එක්සත් ජාතින්ගේ සංවිධානය තුළ ඔබ කරන රැකියාවේ භූමිකාව සකස් වන්නේ කෙසේද?**

එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල රැකියා කිරීම අභියෝගාත්මකයි. රැකියාව කිරීමේදී නිරන්තරව අවිනිශ්චිත වාතාවරණයන්ට

මුහුණ දීමට සිදු වෙනවා. එදා උතුරු නැගෙනහිර යුද්ධය තිබූ කාලයේ හැමවිටම බෝම්බ පිපිරීම, වෙඩි තබා ගැනීම් සිදු වෙනවා. නමුත් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක සාම ක්‍රියාවලිය හා බද්ධව සේවය කිරීමේදී බෝම්බ, වෙඩි තබා ගැනීම් ආදී කුමන බාධක තිබුණත් තමාට නියමිත, පැවරුණු කාර්යයන් කළ යුතුයි. ශ්‍රී ලංකාවේ ඇති වූ සුනාමි අවස්ථාව තවත් එවන් අභියෝගකාරී අවස්ථාවක්. ලොව පුරා ඕනෑම අවස්ථාවක, ඕනෑම තැනක යුද්ධ, ස්වභාවික ව්‍යසන ආදී දෑ සිදු වෙනවා. ලෝකයේ කොහේ හෝ ඉහත කී වතාවරණයන් ආශ්‍රිතව රැකියාව කළ යුතුයි. එමනිසා නිරන්තරව ඇතිවන වෙනස්වීම් වලට අනුගත වීමේ හැකියාවක් තිබිය යුතුයි. එහිදී තමන්ගේ සියලු වැඩ තමන් විසින්ම කළ යුතුයි. ඒ සඳහා ඉහළ මට්ටමේ කැපකිරීමක්, සෑම මනුෂ්‍ය කොට්ඨාශයක් සමඟම ගණුදෙනු කිරීමේ හැකියාව, වැඩ කිරීමේ හැකියාව තිබිය යුතුයි. එවැනි ගුණාංග ඔබ සතු නම් ඔබට මේ ක්ෂේත්‍රයේ රැඳී සිටිය හැකියි.

**තරුණ තරුණියන් ලෙස මෙම අවස්ථාවන්ට ප්‍රවේශ වන්නේ කෙසේද?**

ජාත්‍යන්තර සංවිධානයන්හි ප්‍රජා සේවයේ යෙදීමට නම් ඔබ ප්‍රජා සංවිධානයන්හි සේවය කළ යුතුයි. ස්වෙච්ඡාවෙන් වැඩ කළ යුතුයි. ස්වෙච්ඡාවෙන් වැඩ කිරීම තුළින් තීරණ ගැනීමේ හැකියාව, ස්වාධීනව වැඩ කිරීමේ හැකියාව, අලුත් අලුත් දේ ඉගෙනීමේ හැකියාව විවිධ සංස්කෘතීන්ට ගරු කිරීම ආදි බහුවිධ හැකියාවන් දියුණු වේ. ස්වෙච්ඡා සේවය තුළින් සංවිධානගත වීමට අත්‍යවශ්‍යයි. කණ්ඩායමක් ලෙස එකට වැඩ කිරීම තුළින් ඔබට විවිධ ව්‍යාපෘති කළ හැකියි. සමාජය වෙනුවෙන් ඔබ කරනු ලබන මේ ස්වෙච්ඡා සේවය තුළින් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් දක්වා ඔබව ගෙන යාමට අවස්ථාව උදා වේ. උදාහරණයක් ලෙස සුනාමි වැනි ව්‍යසන අවස්ථාවන්හිදි, සාමය ඇති කිරීමේ කටයුතු වලදි (Peace Keeping Mission) ආදි සේවාවන් තුළින් මෙවැනි සංවිධාන හා එක්ව වැඩකිරීමේ හැකියාව ලබාගත හැකියි. ඒ තුළින් ඔබට එවන් අවස්ථා උදාකර ගත හැකියි. මෙම රැකියාව අවිනිශ්චිත වුවත්, අවධානම් සහගත වුවත්, මුල්‍යමය වශයෙන් ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකියි. එසේම එක් ව්‍යාපෘතියක් අවසන් වූ පසු එවැනි ව්‍යාපෘති බොහෝමයක් ඇතිවෙනවා. එනිසා රැකියාවේ සුරක්ෂිතභාවය පිළිබඳවත් ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. එසේම අවධානම වැඩි වුවත් ඉහළ ආදායමක් ලැබිය හැකියි.

එමෙන්ම මෙවැනි රැකියාවකට යාමෙන් ලෝකය පිළිබඳ අපේ දැක්ම පුළුල් වෙනවා. ශ්‍රී ලංකාවේ අපි බොහෝ විට විවිධ දෘෂ්ටීන්වල හිර වී කටයුතු කරනවා. ඇතැම් විට අපි කරන රැකියාව, පාසල වැනි දේ තුළින් මවාගත්තු ලෝකවල ජීවත් වෙනවා. නමුත් අපි ලෝකයට විවෘත වුනාම ඒ හදා ගත් ප්‍රතිරූප සියල්ල බිඳෙනවා. අපි සේම අන් මිනිසුනුත් ඉහළයි යන අදහස ඇති වෙනවා. අවංක වෙනවා. සරල පැවැත්මක් ඇති වෙනවා. එවන් පුළුල් දෘෂ්ටියක් නොමැතිව මෙම රැකියාව කිරීමට අපහසුයි. මන්ද විවිධ ජන කණ්ඩායම් ජන කොටස් සමඟ වැඩ කිරීමේ දී සීමා මායිම් හදාගෙන වැඩ කළ නොහැකි බැවිනි.

**එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ සේවය කළ හැකි ක්ෂේත්‍ර මොනවාද?**

ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්හි සේවය ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍රය නම් මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, ආපදා කළමනාකරණ වැනි අංශයන්ය. ඒ තුළ,

- මිනිසුන්ගේ ආදායම් තත්ත්වය වැඩි දියුණුව
- මිනිසුන්ට ණය ලබාදීම
- ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදීම
- බැංකු කටයුතු
- ගිණුම් කටයුතු
- සාමය වර්ධනය කිරීම
- ආපදා කළමනාකරණය
- ජීවනෝපාය සංවර්ධනය
- යහ පාලනය
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- මැතිවරණ කටයුතු
- කෘෂිකර්ම

ආදිය ප්‍රධාන වේ. අපේ තරුණ තරුණියන්ට මේ අවස්ථා ග්‍රහනය කර ගැනීම ඉතා පහසුයි. මන්ද ඔවුන් ජීවත් වන්නේ බහු වාර්ගික, බහු ආගමික රටක. එසේම ඔවුන් මිත්‍රශීලීයි. අන් අය සමඟ සහයෝගිතාවයෙන් වැඩකළ හැකියි. සමාජශීලීයි. එසේම ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ඉතා හොඳයි. එමනිසා ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ට ඉහළ පිළිගැනීමක් තිබෙනවා. නමුත් ඒ අතරම අපේ ළමුන් ප්‍රශ්න කරන්නේ නැහැ. පරායත්ත (Dependence) මානසිකත්වයෙන් සිටින්නේ. මෙම තත්ත්වය බොහෝ දෙනාගේ දියුණුවට බාධාවක්. එමනිසා තමන්ගේ අනාගතය ගැන සිතා තමන්ගේ ක්ෂේත්‍රය තමා තෝරාගත යුතුයි. තමාගේ අනාගතය තිබෙන්නේ තමාගේ අතේ. තමාගේ අනාගතේ නිර්මාණකරුවා තමන්මයි.